# කටුගම්පළ ගොවි සමුළුව

1979 අප්‍රේල් 07 සහ 08

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
තැ.පෙ. අංක 1522
කොළඹ.

G31
(SL)
AGR

2009/06

2010/04

# කටුගම්පල ගොවි සම්මේලනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල ජන්ද කොට්ඨාශයේ ගොවි හමුවක්, 1979 අප්‍රේල් මස 07 සහ 08 යන දිනයන්හි දී කන්දැටියන සමූපකාර ගොවිපලේ දී පැවැත් විනි.

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය කලින් දිස්ත්‍රික් බඳව පැවැත් වූ ගොවි සමුළු ජන්ද කොට්ඨාශ බඳව පැවැත් වීම ඇරඹුනේ මෙම ගොවි සමුළුවෙනි. මේ අන්දමට රටේ ගොවි මහතුන් වැඩි දෙනෙකුට මෙම සමුළුවලට සහභාගි වීමටත්, අදහස් හුවමාරු කර ගැනීමටත්, අවකාශ සැලසේ යැයි අදහස් කෙරේ.

මෙම ගොවි සම්මේලනවල පරමාර්ථය වනුයේ එක් එක් පළාත්වල තෝරා ගත් ගොවි මහත්වරුන්, රජයේ නිලධාරීන් සහ දේශපාලනඥයින් අතර එකම වේදිකාවේ දී අවංකව, නිදහස්ව සහ ඍජුව අදහස් හුවමාරුවකට ඉඩකඩ සලසා දීම යි.

තවද, පලදා වර්ධන කමිටු හා ගොවි කාරක සභා විසුරුවා හැරීම හා ඒ වෙනුවට ගොවිජන සේවා කාරක සභා සහ වගා නිලධාරීන් පත් කිරීම, කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය පිහිටුවීම වැනි නව සංවර්ධන කටයුතු රැසක් ආරම්භ කර ඇති මේ අවදියේ දී මේ වැඩ සටහන් ගැන ප්‍රචාරයක් හා අවබෝධයක් ගොවීන් අතර ඇති කරලීමත්, ඒ ගැන ගොවීන්ට අදහස් හා ගැටළු ඇත්නම්, ඒවා ගැන ප්‍රතියෝජනා ලබා ගැනීමත්, මේ සම්මේලනවල අරමුණු වේ.

22185

22185

# ආරම්භක දේශනය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දිසා ඇමති හා කටුගම්පල මහජන මන්ත්‍රී,
ජයවික්‍රම පෙරේරා මැතිතුමා.

ගොවි ප්‍රශ්න වටහා ගැනීමටත්, ඒ ප්‍රශ්න දෙස බැලිය යුත්තේ කෙසේ ද යන්න ගැන ගම් මට්ටමින් සොයා බැලීමටත්, ගොවි සම්මේලන ගණනාවක් ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මීට ඉහත වතාවක දී රටේ විවිධ පළාත්වල පවත්වා තිබේ. මෙම සම්මේලනවල දෙවන වටයේ ආසන මට්ටමින් පවත්වන ගොවි සමුළුවල පළමුවැන්න ආරම්භ කිරීමට මට අවස්ථාවක් සලසා දීම ගැන පළමුවෙන් ම මාගේ ස්තුතිය පළ කරන්නෙමි.

මෙම සමුළුවට කුරුණෑගල දිස්ත්‍රික්කය තෝරා ගැනීමට කරුණු කිහිපයක් ම හේතු වී තිබේ. ඉන් වැදගත්ම කරුණ වන්නේ ලෝක බැංකු ආධාර ක්‍රමයක් යටතේ මෙම දිස්ත්‍රික්කයේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කෙරෙන විශේෂ වැඩ පිළිවෙළක් තිබීම යි.

මෙතෙක් කල් අපට හුරු වී තිබුනේ නිලධාරීන් මේ ප්‍රශ්න දෙස බලා පවසන කරුණු පිළිගැනීමට යි. නමුත් මේ ක්‍රමයේ අසාර්ථක භාවය අප කොයි කාටත් වැටහී ගොස් ඇත. මේ වගේ අවස්ථාවක දී ගොවි මහතුන්ටත්, නිලධාරීන්ටත්, මැති ඇමතිවරුන්ටත්, එකට රැස් වී සාකච්ඡා කර නිදහස් අන්දමින් අදහස් හුවමාරුවක් ඇති කර ගැනීමෙන් මේ ප්‍රශ්න පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමටත්, ඔවුනොවුන් ගේ අත්දැකීම් හා දැනුම අනුව ඒවාට යෙදිය යුතු පිළියම් මොනවා දැයි යන්න සොයා බැලීමටත් අදහස් කරයි.

ගොවියෙකු රැකෙන්නේ ගොවිතැනෙන් ලැබෙන ආදායමිනි. ඔවුන් ගොවිතැන්වලට වුවමනා මුදල් බොහෝ විට ලබා ගන්නේ ණයට යි. ඔවුන්ට අවශ්‍ය පෝර, කෘෂි රසායන, අනෙකුත් යෙදවුම් කලට වේලාවට ඔවුනට නොලැබුණොත් එම කටයුතු සාර්ථක වන්නේ නැත. ඒ වගේ ම ගොයමට ලෙඩ රෝගයක් වැළඳුන විට කල් ගත වී ඊට පිළියම් යෙදීමෙන් වැඩක් වන්නේත් නැත. විශේෂයෙන් ගොවිතැන් කටයුතු සිදු කිරීම කලට වේලාවට සිදු කළයුතු දෙයකි. මේ කටයුතුවල නිරත නිලධාරීන් තම රාජකාරී හරි හැටි ඉටු නොකරන විට පාඩුවන්නේ ඒ අහිංසක ගොවි මහත්වරුන්ට ය. යම් රජයක් මහජනයා විසින් පත් කළායින් පසුව මේ සේවාවන් ගම් මට්ටමේ දී ලබා දෙන්නේ රජයේ නිලධාරීන් මගිනු යි. ඔවුන් තම කාර්ය හරිහැටි ඉටු කරන්නේ නැතිනම් පළාතේ මන්ත්‍රීතුමාත්, රජයත් අපකීර්තියට භාජනය වීම වැළැක් විය නොහැකි යි.

සැලසුම් කරන ඉලක්ක අනුව රජයේ අය වැයෙන් ඒ ඒ අංශයට අවශ්‍ය මුදල් වෙන් කරනු ලැබේ. මේ මුදල් ඒ ඒ කටයුතු භාර දෙපාර්තමේන්තුවලට ලබා දුන් පසු ආසන මට්ටමේ දී ඒ ඉලක්කවලට අනුබද්ධ සැලසුම් සකස් කර ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කළයුතු යි. නොඑසේ නම්, රජයේ වැඩ සටහන්වලින් වැඩක් සිදු වන්නේ නැත. මෙහි දී උදාහරණයක් දක්වන්න පුළුවනි. පොල් වගා මණ්ඩලයේ සහනාධාර සලකන විට ඒවා ඝාල් ඉඩම්වල පස සංරක්ෂණය, හිස්තැන් පිරවීම,

නැවත වගාව යනාදී කටයුතු රාශියකට වැදගත් වේ. වැඩ සටහන් ලිපි ගොනුවල මෙසේ පෙන්වූ වත් ඇත්තවශයෙන් නියම තත්වය සොයා බැලුව හොත් හැම රජයක් ම මේ අන්දමට නිදහස් කරන මුදලින් වාර්ෂිකව වියදම් කර ඇති මුදල් ප්‍රමාණය 50% කටත් අඩු යි. මෙයින් පැහැදිලි වන්නේ එතන දී යම් කිසි ප්‍රශ්නයකට මේ වැඩ සටහන් මුහුණ පාන බව යි. පින් එකක් නම් ඒ ලැබෙන සහනාධාර වලින් ප්‍රයෝජන ගැනීමට ගොවීන්ට අවස්ථාවක් නැත්තේ ඒ අය ගෙන් බොහෝ දෙනෙක් මේ සහනාධාර ක්‍රම මොනවා ද, ඒවා ප්‍රයෝජනයට ලබා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ විස්තර නොදැනීම යි.

කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය මගින් කෘෂිකර්ම සංවර්ධන අධිකාරියක් ඇති කරන ලද්දේ නිලධාරීනුත්, ගොවීනුත් අතර ඇති මේ පරතරය නැති කර ඒ දෙගොල්ලන් අතර සම්බන්ධීකරණයක් ඇති කිරීමට ය. මේ පළාත්වල උප දිසාපතිවරුන් මුල දී ඒ ඒ කොට්ඨාශයේ ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරියා හැටියට කටයුතු කරන ලදී. නමුත් රට නීතිමය බලයක් ඔහුට ඒ සඳහා තිබී නැත. එදිනෙදා පරිපාලන කටයුතුවල වැඩ කටයුතු රාශියක් ඔහුට ඉටු කිරීමට සිදු වීම නිසා සම්බන්ධීකරණය එතරම් සාර්ථක වූයේ නැත. දැන් උප දිසාපතිවරුන් ඒ ඒ ප්‍රදේශයේ පරිපාලන කටයුතු සම්බන්ධව ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරියා හැටියට නම් කර ඇති අතර, සංවර්ධන අංශයේ ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරී තැන හැටියට කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ ආසන කළමණාකරු අප විසින් පත් කර ඇත්තෙමු.

අඟනුවර සකස් කරන සැලැස්මවල් ආසන බඳ තත්වයන්ට ගැලපීමේ දී නොයෙක් අඩුපාඩුකම් ඇති විය හැක. උදාහරණයක් මෙසේ දක්වන්න පුළුවන්. යම් ගොවි මහතුන් පිරිසකට පැල වර්ගයක් අවශ්‍යව තිබෙනවා යයි සිතමු. නිලධාරී තැන ද ඔවුනට පැල ලබා දීමට පොරොන්දු විය හැකි යි. අනතුරුව ගොවීන් වලවල් කපා බලා සිටී. වැස්සක් ඉවර වෙන තුරු පැල ලැබෙන්නේ නැත. ඊට හේතුව පැල ගෙන ඒම තවත් දුර බැහැර දිස්ත්‍රික්කයක ගොවිපලකින් කළයුතු වීමත්, ප්‍රවාහන අපහසුව, පැල සැපයීමට කල් ගත වීම, ඒත් නොමැති නම් ප්‍රමාණවත් පැල සංඛ්‍යාවක් ලබා ගැනීමට නොහැකි වීමත් වැනි ප්‍රශ්න වලට නිලධාරී තැනට මුහුණ දීමට සිදු වීම යි. මේ වාගේ තත්වයක් ඇති වන්න ප්‍රධාන හේතුව ඒ කටයුතුවල සම්බන්ධීකරණයේ ඇති දුර්වලතාවය යි.

මේ වගේ තත්වයකට ආසන මට්ටමේ දී කළ පිළියමක් හැටියට කටුගම්පල ආසනයේ කන්දැටියන සමූපකාර ගොවිපලේ පැල තවාන සඳහන් කළ හැකි යි. ඊට අවශ්‍ය මුදල් ලබා ගත්තේ විමධ්‍යගත කළ අයවැයෙන් මුදා හැරී රු.75,000 ක මුදලකිනි. මෙම තවානෙන් ආසනයේ ගොවීනට අවශ්‍ය තරමට පැල සකස් කර තිබේ. දැන් අවශ්‍යව ඇත්තේ සැලැස්මක් සකස් කර ගොවීනට මේ පැල බෙදා දීම ය. එහිදී නිලධාරීන්ට පුළුවන් සැලැස්මක් සකස් කර ගොවි මහත්වරුන්ට පොරොන්දු වෙන්න මෙච්චර වලවල් කපන්න, අප ඒවාට ඕනෑ කරන පැල සපයා දෙනවා කියා. මෙයින් පෙනී යන්නේ ඒ අන්දමට වැඩ සංවිධානය කර ගැනීමෙන් ආසන මට්ටමේ දී වුවත් අඩු ගානේ නිලධාරි මහත්වරුන්ට විශ්වාසයක් ඇතිව කටයුතු කරන්න පුළුවන් බව ය. දැන් මේ පැල බෙදා දීමෙන් පමණක් මේ කටයුත්ත ඉවර වෙන්නේ නැත. ඒ පැල ලොකු වන තුරු පරීක්ෂා කර ඒවායේ පල ප්‍රයෝජන ගන්නා තැනට ඉඩ සැලසීමට වග බලා ගැනීම ඊළඟට ඔහු සතු වැදගත්ම කාර්යය යි.

මේ කටයුතුවල දී අප තවත් කාරියක් ඉටු කරන්න යෙදුනෙමු. එය නම් ගම් මට්ටමේ මේ කටයුතු සංවිධානය කිරීමට වගා නිලධාරීන් පත් කිරීම ය. මේ අයට ප්‍රදේශයේ විශාල වැඩ කොටසක් කරන්න පුළුවනි. එමගින් ඔහුට ඒ ප්‍රදේශයේ හොඳම ජනප්‍රිය පුද්ගලයා වෙන්නට ද හැකි ය. ඒ කරුණ හැම නිලධාරියෙකුම දැඩි අවධාරණයකින් වටහා ගත යුතු කරුණකි. ඔහු ගොවියාට රජයේ විවිධ ආධාර ක්‍රම ලබා ගන්නට සලස්වා ඒ ගොවි මහත්වරුන්ට ඔවුන් ගේ ඉඩම් කැබලි වලින් ඉහළම ආදායමක් ලබා ගන්නට ඉඩ සලස්වා දීම වැදගත්. කෙටියෙන් කියතොත් ගම් මට්ටමේ දී සංවර්ධන කටයුතුවල සම්බන්ධීකරණ නිලධාරියා වන්නේ ඔහු ය. ඔහු ඒ කටයුතු සාර්ථකව ඉටු කළ තරමට වගා නිලධාරීන් පත් කිරීමේ රජයේ අරමුණු ඉටු වේ.

මෙරට අනාදිමත් කාලයක පටන් ගොවිතැන් බත් කෙරෙන රටකි. ගොවිතැන විශාල ආශ්වාදයක්, මානසික තෘප්තියක් ලැබෙන වෘත්තියකි. 'මඩ සෝදා ගත් ගොවියා රජකමට ඔබින්නේ ය' යන ඓතිහාසික කියමන අප සිහි දරා ගෙන අපේ කටයුතු නොපිරිහෙළා ඉටු කරමු.

ගොවි සමුළුව ගැන හැඳින්වීමක්.

එස්.බී.ආර්. නිකහැටිය මහතා, පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි,
ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

අද ශ්‍රී ලංකාවේ නොයෙකුත් මට්ටමේ සාකච්ඡා, රැස්වීම්, සම්මේලන යනාදිය පැවැත් වේ. එහෙත් ගොවි මහතුන් ගේ ප්‍රශ්න ගැන සාකච්ඡා කරන මෙබඳු සම්මේලනවලට ගොවි මහතුන් සහභාගි කරවා ගැනීම, දක්වා ලැබෙන්නේ කලාතුරකිනි. සම්මේලනවලට සහභාගි වන නිලධාරීන් බොහෝ විට ගොවි මහතුන් ගේ ප්‍රශ්න හැම එකක් ගැනම හොඳ අවබෝධයක් ඔවුන් තුළ ඇතැයි බොහෝ විට අදහස් කරති. එම ආකල්පය වැරදි බව දැන් හොඳ හැටි වැටහී ගොස් තිබේ. මෙම ගොවි සමුළුව තුළින් ගොවි මහතුන්ටත්, නිලධාරීන්ටත්, එසේම ප්‍රතිපත්ති සකස් කරන පාලක පක්ෂ යටත්, එකම වේදිකාවේ මේ ප්‍රශ්න ඉස්මතු කර ඒවාට විසඳුම් සොයන්න අවස්ථාවක් ලබා දීමට අදහස් කර ඇත.

කලින් ද සඳහන් වූ පරිදි පළමු වැනි සම්මේලන වාරයට වඩා මෙම දෙවන සම්මේලන වාරයේ මේ ගොවි සමුළුවල යම්කිසි වෙනස්කමක් අප විසින් සිදු කර ඇත්තෙමු. සම්මේලන මාලාවේ උදේ වරුවේ මෙම දිස්ත්‍රික්කයේ එක් එක් දෙපාර්තමේන්තුවල සේවාවන් ගැන ඒ ඒ දෙපාර්තමේන්තු වලින් නියෝජනය කරන නිලධාරි මහත්වරුන් විසින් විස්තරයක් ඉදිරිපත් කරනවා ඇත. එහි දී ඒ දෙපාර්තමේන්තුවල අද කෙරෙන කටයුතු ගැන ගොවි මහතුන්ට කිසියම් අවබෝධයක් ලබා දීමට අදහස් කළෙමු.

සවස් වරුවේ දී එක් එක් දෙපාර්තමේන්තු ක්‍රියාත්මක කරන ඒ සංවර්ධන වැඩ සටහන් සම්බන්ධව ගොවි මහතුන් මුහුණ පාන ප්‍රශ්න ඉදිරිපත් කරනවා ඇත. මේ අදහස් හුවමාරුවෙන් ඔවුනොවුන්

හට මුහුණ දීමට සිදු වන ගැටළු සහගත තත්වයන්ට විසඳුම් ලබා ගන්නේ කෙසේ ද, යන්න පිළිබඳව ප්‍රතියෝජනා ඉදිරිපත් කෙරේ යයි අදහස් කෙරේ. මෙම සාකච්ඡා වාරය පිළිවෙළක් ඇතිව පැවැත් වීම උදෙසා අපි කොටස් හතරකට ඔහි වැඩ කටයුතු බෙදා තිබේ. ඒවා නම් ;

1. කෘෂිකාර්මික ව්‍යාප්තිය
2. ගොවි ණය
3. කෘෂි භෝග අලෙවිය
4. ගොවි විනය පිළිබඳ නීතිමය ප්‍රශ්න

මින් පසුව සාකච්ඡා වාරය අවසානයේ දී ගොවි මහතුන් කණ්ඩායම් වශයෙන් බෙදී තමුන් ඒ ඉදිරිපත් කළ ප්‍රශ්න හා ඒවාට සැපයුනු පිළිතුරු යනාදිය ගැන සාකච්ඡා කර ඒ පිළිබඳ ඔවුන් ගේ රපෝර්තු හෙට සම්මේලන වාරයේ දී ඒ ඒ කණ්ඩායම් විසින් ඉදිරිපත් කළයුතු වේ.

කෘෂිකර්ම ව්‍යාප්ති වැඩ සටහන්.

ඩබ්ලිව්.බී. අබේසිංහ මහතා, අතිරේක දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී, කුරුණෑගල.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන සංවර්ධන වැඩ සටහන්වලට අදාළව විශේෂයෙන් කුඩුගම්පල ඡන්ද කොට්ඨාශයේ සිදු කෙරෙන වැඩ කටයුතු පිළිබඳ විස්තරයක් මෙහි දී ඉදිරිපත් කිරීමට මා අදහස් කරමි.

ගොවීන් සමූහ වශයෙන් සංවිධානය කර ව්‍යාප්ති කටයුතු පුළුල් කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කටයුතු සාර්ථක අන්දමින් කිරීමට වැදගත් වන කරුණකි. මේ මගින් වඩා සාර්ථක හා කාර්යක්ෂම සේවයක් අපට ගෙන දීමට හැකි වේ. ඒ ලෙස දැනට අප කටුගම්පල කොට්ඨාශයේ ගොවීන් සමූහ වශයෙන් සංවිධානය කර ගෙන යන්නෙමු. අඩුම වශයෙන් ගොවිපලවල් 600 කට එක් ව්‍යාප්ති සේවක මහතකු බැගින් පත් කිරීමට අප බලාපොරොත්තු වන නිසා ද ව්‍යාප්ති සේවක වරයකුට හැම ගොවියකු මුණ ගැසීමට තරම් ඉඩ ප්‍රස්ථාවක් ලැබෙනවා ඇත.

ආදර්ශ ගොවිපලවල් පිහිටුවීම තවත් වැදගත් දෙයකි. වගා නිලධාරීන් හැම කෙනෙකුම වාගේ ආදර්ශ ගොවිපලවල් සිය කොට්ඨාශවල පවත්වා ගැනීම වැදගත් වන අතර, ඒවාට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ සහාය ලබා දිය හැකි ය. මේ ආදර්ශ ගොවිපලවල් මගින් නව රෝපණ ද්‍රව්‍ය වැවීමේ ක්‍රමත්, පර්යේෂණ අංශවල සොයා ගන්නා අභිනූත් තොරතුරුත් ගොවි මහතුන් වෙත ගෙන ඒමට හැකි වේ යැයි බලාපොරොත්තු වේ. තවද, ප්‍රදේශයේ කුඹුරුවල පවතින පස් වර්ගවලට අදාළව බෝග වගා කිරීමේ දි ඇති වන ගැටළුත්, එවැනි භෝගවල ප්‍රදේශයට ආවේණික රෝගාබාධ යනාදියත් පර්යේෂණ අංශයට ඉදිරිපත් කර එම අංශයේ නිලධාරීන් මෙහි කැඳවා ඒවාට පිළියම් ලබා දීමට ද කටයුතු කරන්නෙමු.

අතින් අතින් මේ රටේ දක්ෂ ගොවි මහතුන් ගේ අත්දැකීම් සම්භාරයෙන් ප්‍රයෝජන ගැනීමට ඉඩ සලසා දීමට අප අදහස් කර ඇත්තෙමු. ව්‍යාප්ති නිලධාරීන් ඔවුන් හා දැනුම හුවමාරු කර ගැනීමෙන් අන්‍යෝන්‍යව ප්‍රයෝජන සලසා ගත හැකි යි.

කටුගම්පල ඡන්ද කොට්ඨාශයේ බීජ්තර වී නිපදවීම නව වැඩ පිළිවෙළක් යටතේ සංවිධානය කිරීමට අප අදහස් කර ඇත්තෙමු. පර්යේෂණාගාරවලින් ලබා ගන්නා බීජ්තර වී එම ගොවීනට ලබා දීමෙන් මෙහි නිපදවන බීජ්තර වී වල තත්වය වැඩි කිරීමට එහි දී කටයුතු කරනු ඇත.

මෙම පළාතේ බද්ධ කළ අඹ පැලවලට විශාල ඉල්ලුමක් තිබේ. කෙසේ වුව ද, මේ පැල බද්ධ කිරීමට සෑහෙන කාලයක් ගත වන නිසාත්, දැනට ඒවා බෝ කිරීම විශාල වශයෙන් නොකෙරෙන නිසාත්, එම ඉල්ලුම් සපුරා ලීමට අපහසු ය. මේ ප්‍රශ්නයට විසඳීමක් වශයෙන් අප මෙම ඡන්ද කොට්ඨාශය තුළ තවාන් පිහිටුවා බද්ධ කළ අඹ පැල නිපදවීමට අදහස් කර ඇත්තෙමු.

මී මැස්සන් ඇති කිරීම කටුගම්පල ආසනයට ඉතාම සුදුසු කාර්යයකි. මෙය පොල් වගා කරන හැම ප්‍රදේශයකම වාගේ ඒ අන්දමට කළ හැකි ය. කෙසේ වුව ද, මේ සඳහා සෑහෙන දැනීමක් හා පුහුණුවක් ද මී මැසි පෙට්ටි ද අවශ්‍ය වේ. මේ අවශ්‍යතා සපුරා ලීමට ද කටයුතු කරන්නෙමු.

ගොවිජන සේවා.

කරුණාරත්න මහතා, ගොවිජන සේවා සහකාර කොමසාරිස්, කුරුණෑගල දිස්ත්‍රික්කය.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මෙරට ගොවීනට අත්‍යවශ්‍ය සේවාවන් රැසක් ඉටු කරන දෙපාර්තමේන්තුවකි. දිස්ත්‍රික්කයේ කාර්යාලය කුරුණෑගල පිහිටුවා තිබෙන අතර, සෑම පළාත් පාලන ආයතන ප්‍රදේශයක් වෙනුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථානයක් පිහිටුවා තිබේ. එම මධ්‍යස්ථානය භාරව කටයුතු කරන්නේ ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරිවරයෙකු ය.

අප මේ අන්දමට ගොවිජන ක්ෂේත්‍රයේ කරන කටයුතු මොනවා ද? මෑතක් වන තුරුම පැවති අන්දමට ගොවිජන සේවා මධ්‍යස්ථානවලට පමණක් යෙදවුම් සැපයීමේ කටයුතු සීමා වීමෙන් ග්‍රාමීය මට්ටමේ සේවය පුළුල් කිරීමට හැකියාවක් නොවීය. වගා නිලධාරීන් පත් කිරීම නිසා ගම් මට්ටමින් වඩා පුළුල් සේවයක් කිරීමේ හැකියාව ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට ලැබී ඇත. මේ අයට අයත් වන වැදගත් කටයුත්තක් වන්නේ ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම යි. කුඹුරු වගාව, සාමූහිකත්වයෙන් තොරව කිරීමට හැකි කටයුත්තක් නොවේ. විවිධ අදහස් දරණ, විවිධ සිතුම් පැතුම් ඇති ගොවීන් පිරිසක් එකම යායේ එකම ගමේ කටයුතු කරති. තවද, විවිධ පස් වර්ග විවිධ තත්වයේ වගා කටයුතු කිරීම ද හේතු වේ. නමුත් යායේ වැඩ කටයුතුවලට එකම වැඩ සටහනක් අනුව කිරීම සාර්ථක ගොවිතැනකට ඉතාමත් වැදගත් කාර්යයකි.

සියලු ම සුළු වාරිමාර්ග ව්‍යාපාරවල කන්න රැස්වීම්වල දී ගත් තීරණවලට අනුව වගා කරන වී වර්ග, වගා කාල සටහන සහ අනෙකුත් කාර්ය භාරයන් පවත්වා ගැනීම පිළිබඳව ගන්නා සාමූහික තීරණ කඩ කරන ගොවීන් සිටින්නේ නම් ඔවුනට විරුද්ධව ගන්නා විනයානුකූල ක්‍රියා මාර්ගය කුමක් ද? මෙතන දී ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව ගන්නා ක්‍රියා මාර්ගය වන්නේ ළඟදී ම පැන වෙන ගොවිජන සේවා පණතෙහි විධි විධාන මගින් විශේෂයෙන් ගොවිතැන් ක්ෂේත්‍රයේ සාමූහික තීරණ කඩ කරන ගොවීන් සිටින්නේ නම් ඒ අයට විරුද්ධව නීති වශයෙන් කටයුතු කිරීම ය.

ජලය බෙදා හැරීමේ කාර්ය භාරය මින් ඉදිරියට වගා නිලධාරී මහතුන් විසින් කරනවා ඇත. පෝර, බීජතර වී, කෘමි හා වල් පැළෑටි නාශක බෙහෙත් යනාදී සියලු ම යෙදවුම් ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ලබා ගැනීමට ඉඩ සැලැස්වීමට බලාපොරොත්තු වේ. බීජතර වී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් බෙදා හරිනු ලැබේ. කෙසේ වුවත්, රට සහාය දීමක් වශයෙන් බීජතර වී ස්වල්ප වශයෙන් බෙදා හැරීමට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ද බලාපොරොත්තු වන අතර, එසේ බෙදා දෙන බීජතර වී වලට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහතිකය අප විසින් ලබා ගන්නවා ඇත.

සුළු වාරිමාර්ග කටයුතු 1972 වන තුරු ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පැවරී තිබුණ කාර්ය භාරයකි. එම කාලයේ දී විධායක ඉංජිනේරු සේවය පිහිටුවීම හේතු කොට ගෙන මේ සියලු ම වාරිමාර්ග කටයුතු එකම ඉංජිනේරු සංවිධානයකට පැවරිණි. කෙසේ වුවත්, 1974 දිස්ත්‍රික් අය වැය යටතේ සුළු වාරිමාර්ග ඉදි කිරීමේ කටයුතු පවරා තිබුනේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ය. මෙහෙන්දී සුළු වාරිමාර්ග යනුවෙන් අදහස් කරන්නේ ගම් වැව් හෝ අමුණු ආදියෙන් අක්කර 200 කට අඩු කුඹුරු යායක් පෝෂණය කෙරෙන්නා වූ හෝ රුපියල් ලක්ෂයකට අඩුවෙන් වියදම්ව ඇති වාරිමාර්ග ව්‍යාපාරයක් ය. මේවායේ වැඩකට රු.15,000 නොඉක්මවන නඩත්තු කටයුතු පමණක් ඉටු කිරීම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පවරා තිබේ. මෙලෙස ඉටු කිරීමට බලාපොරොත්තු වන වැඩ නම් වැවක සොරොව්ව කැඩී බිඳී ගිය හොත් එය නැවත බැඳීම, වෑකඩු පවත්වා ගැනීම, වැව ගොඩ වී ඇත්නම් පස් කට්ටි කපා වෑකන්දට දැමීම යනාදි කටයුතු ය. ඒ වැඩ වලට කටයුතු කිරීමට බලාපොරොත්තු වන්නේ ඇස්තමේන්තු පිළියෙළ කොට කම්කරුවන් යොදවා නොවේ. මේ කටයුතු ග්‍රාම සංවර්ධන සමිතිවලට කොන්ත්‍රාත් වශයෙන් දීමට බලාපොරොත්තු වන අතර, ඒවායේ සුපරීක්ෂාව වගා නිලධාරීන්ට පැවරෙනවා ඇත. වැවේ අවශ්‍යතාව ඇත්තේ ගමේ අයට ය. එබැවින් ගමේ ම ග්‍රාම සංවර්ධන සමිතියට එම වැඩ ඔවුන් ගේ අවශ්‍යතාවයට අනුව කර ගැනීමට අවස්ථාවක් සැලසෙන නිසා වැඩ අවසාන වූ පසු ඒ ගැන තවත් කාටවත් දොස් පැවරීමක් කිරීමට උවමනාවක් එහි දී ඇති වන්නේ නැතැයි බලාපොරොත්තු වේ.

අද ගොවි ආරවුල් හා වෙනත් කෘෂිකාර්මික ආරවුල් විසඳීම දැනට නවත්වා තිබේ. එසේ නවත්වා තිබෙන්නේ ගොවිජන සේවා පණත පැන වෙන තුරු යි. යම් ආරවුලක් සම්බන්ධව ගොවිජන සේවා මධ්‍යස්ථානයකට වාර්තා කල පසුව ඒවා සම්බන්ධව ගොවිජන සේවා පණත අනුමත වූ වහාම සුදුසු පරිදි අවශ්‍ය නීතිමය කටයුතු කිරීමට අප බලාපොරොත්තු වෙමු.

කුඹුරු වැඩ නොකරන කන්නවල දී වෙනත් බෝග වගා කිරීම ජනප්‍රිය කරවීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට ද අදහස් කර තිබේ. මේ සඳහා සුදුසු වැඩ සටහනකට වගා නිලධාරීන් සහ ගොවි මහත්වරුන් සම්බන්ධව කර ගැනීමට බලාපොරොත්තු වන අතර, අඩුම වශයෙන් එක ආදර්ශයක් වත් එක් යායක පිහිටුවීමට බලාපොරොත්තු වෙමු. මෙම ආදර්ශ කටුගම්පලින් ආරම්භ කර මුළු දිස්ත්‍රික්කයේ ම ව්‍යාප්ත කිරීමට ද අප අදහස් කරන්නෙමු.

සුළු අපනයන බෝග වගා කිරීම ව්‍යාප්ත කිරීම.

එස්. බී. පෙරේරා මහතා, ව්‍යාප්ති නිලධාරී, සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව, කුරුණෑගල.

ශ්‍රී ලංකාවේ පොල් වගා කරන ප්‍රධාන ප්‍රදේශයක් වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ අද පොල් අක්කර යකින් ලැබෙන සාමාන්‍ය අස්වැන්න පොල් ගෙඩි 2,500 ක් පමණක් යයි සැලකේ. මේ අනුව පොල් අක්කරයකින් කෙනෙකුට ලබා ගැනීමට පුළුවන් ආදායම රු.850 ත් රු.1,000 ත් අතර මුදලකි. මේ නිසා පොල් ඉඩම්වලින් මීට වඩා ආදායමක් ලැබෙන ක්‍රමයක් සකස් කර ගැනීම අද රටේ තත්වය අනුව ප්‍රමුඛතාවයක් ලැබී ඇති කටයුත්තක්ව පවතී. මේ සඳහා සාමාන්‍යයෙන් බලන විට ක්‍රම තුනක් උපයෝගී කර ගැනීමට පුළුවනි. ඒවා නම් ;

1. සතුන් ඇති කිරීම.
2. මෝසම් බෝග වගාව හා
3. අතුරු බෝග වගාව යි.

සතුන් ඇති කිරීම විශාල මුදලක් ආයෝජනය කළයුතු කාර්යයකි. අනිත් අතින් සෝයා බෝංචි, බඩ ඉරිඟු, කෝපි හා ගම්මිරිස් සාර්ථක අන්දමින් පොල් වගා කරන ඉඩම්වල කළ හැකි අතුරු වගාවන් ය. මේ සම්බන්ධව අපට ඉන්දියාවෙන් පාඩම් ඉගෙන ගන්නට පුළුවනි. දකුණු ඉන්දියාවේ ගොවීන් පොල් ඉඩම්වල අක්කර 17,000 ක් පමණ ගම්මිරිස්, කෝපි හා අන්නාසි හුදෙක් අහස් දියෙන් පමණක් වගා කර විශාල ආදායමක් ලබා ගනී. එහි හැම පොල් ගසකටම වාගේ ගම්මිරිස් වැල් යා කර ඇති අතර, පොල් ගස් අතර කෝපි පැල පේළි දෙකකුත්, එයට මැදින් අන්නාසි පේළියකුත් බොහෝ විට වගා කර තිබේ. වගාවට සුදුසු ඉඩම්වල හිඟයක් ඇති රටවල තිබෙන ඉඩම්වලින් උපරිම ප්‍රයෝජනයක් ලබා ගත හැකි වගා ක්‍රමයක් ලෙස මේ අතුරු වගාව අපට හැඳින් විය හැක.

අක්කරයකට දළ වශයෙන් කෝපි පැල 360 සිට 400 දක්වා ප්‍රමාණයක් වවන්නට පුළුවන. කෝපි පැලයක වයස අවුරුදු තුනක් ඉක්ම වූ පසු පලදරයි. එලෙස එක පැලයකින් කෝපි ඇට අඩුම තරමේ රාත්තල් කාලක් බැගින් වත් ලැබෙනොත් ගොවි මහතෙකුට රුපියල් 1,000 ක් අමතර ආදායමක් හැටියට අවුරුද්දකට ලබා ගත හැකි ය. ගම්මිරිස් වැල් 400 ක් වවා තිබුණොත් රු.1,500 ක අමතර ආදායමක් ලබා ගත හැක. මේ අතුරු බෝග දෙකම වගා කළොත්

අක්කරයකින් තව අමතර ආදායමක් හැටියට රු. 2,500 ක් ලබා ගත හැකි බව මෙයින් පැහැදිලි වේ.

කලින් සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව මේ බෝග විවිධාංගකරණ කටයුතු කරන්නට දුන්නේ ණය මුදලකි. ඒ වෙනුවට අද රු. 2,500 ක සහනාධාර මුදලක් දීමට කටයුතු කර ගෙන යයි. මෙයට අමතරව අවශ්‍ය පැල සියල්ලම වාගේ නොමිලේ ම සපයා දීමටත් බලාපොරොත්තු වන අතර, පොල් වගා මණ්ඩලයේ විශේෂ සහනාධාර ක්‍රමයක් ද මේ උදෙසා සලස්වා තිබේ.

මෙම මිශ්‍ර වගාවන් ඇති කිරීමට 1977 මහ කන්නයේ දී කෝපි පැල 13,900 කුත්, ගම්මිරිස් පැල 1,300 කුත් පල්ලේකැලේ තවාන් වලින් ගෙන්වා බෙදා දීමට අපි කටයුතු කළෙමු. 1978 යල කන්නයේ දී කෝපි පැල 40,500 කුත් (පොල් සංවර්ධන සහනාධාර ක්‍රමය යටතේ 5,500 ග්‍රාම සංවර්ධන සමිතිවලට 5,200, කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය මගින් 5,700, උප දිසාපති හා ග්‍රාම සේවක/වගා නිලධාරීන් මගින් 24,000) 1978 මහට කෝපි පැල 69,000 ක්, ගම්මිරිස් පැල 5,[illegible] ක්, කරාබු 5,300 ක්, සාදික්කා 295 ක් අප බෙදා දී ඇත. මේවා විශාල මුදලක් වැය කර සකස් කර තවාන් වලින් ලබා ගන්නා බැවින් (රජයට කරාබු පැලයක් සකස් කිරීමට රු. 1,00 ක් ද, කෝපි පැලයකට ශත 50 ක් ද, ගම්මිරිස් පැලයකට ශත 80 ක් ද, සාදික්කා පැලයකට ශත 50 ක් ද, ආදී වශයෙන් වැය වේ). ලබා දෙන පැල වලින් උපරිම ප්‍රයෝජනයක් ගැනීමට කටයුතු කළයුතු ය.

දැන් මහයාය වත්තේ දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති තවානෙන් විශාල පල ප්‍රයෝජනයක් ලැබේ. එබඳු තවාන් ගොවිපලවල් හැම මැතිවරණ කොට්ඨාශයකම වාගේ ඇති කර ගැනීමට හැකි වුවහොත් පිටින් රෝපණ ද්‍රව්‍ය ගෙන්වීමට කරදර වීමක් අවශ්‍ය වන්නේ නැත. 1978 දී මෙම තවානෙන් පැල 42,000 ක් ද, 1978 මහේ දී පරණක් කෝපි පැල 1,35,000 ක් ද, 1979 යාලේ දී කෝපි පැල 2,00,000 ක් ද, සකස් කර තිබේ. මේවා සහනාධාර ලැබෙන අයට මිල දී ගැනීමටත්, කුඩා වතු හිමියන්ට පැල නිශ්චය බැගින් නොමිලේ සැපයීමටත්, බලාපොරොත්තු වෙමු. කටුගම්පල ආසනයේ සුළු වතු හිමියන්ට කෝපි පැල 45,000 කුත්, ගම්මිරිස් පැල 25,000 කුත්, වෙන් කර තැබීමට මෙහි දී බලාපොරොත්තු වෙන බව මා මෙහි දී විශේෂයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

ලෝක බැංකු ආධාර ක්‍රමය යටතේ ඊළඟ අවුරුදු පහ ඇතුළත දී ප්‍රදේශයේ පොල් වගාව යටතේ කෝපි, ගම්මිරිස් සහ කොකෝවා අක්කර 8,000 ක් අතුරු වගා ඇති කිරීමට ඉලක්ක කර තිබේ. මෙම දිස්ත්‍රික්කයට අවශ්‍ය පැල සැපයීමට තවාන් හයක් අප කටුගම්පල, දඹදෙණිය, කුලියාපිටිය, පොල්ගහවෙල, දොඩම්ගස්ලන්ද සහ මාවතගම ඇති කර තිබේ. ඒවා මගින් අවශ්‍ය පැල ප්‍රමාණය ලබා ගැනීමටත්, සාධාරණ ලෙස බෙදා හැරීමටත්, අනතුරුව ගොවිපලවල ඒවා ක්‍රමානුකූලව රෝපණය කිරීමටත්, බලාපොරොත්තු වේ.

මෙම අතුරු බෝග වගා කටයුතු මෙම ප්‍රදේශයේ ගොවීනට අලුත් දෙයකි. එබැවින් මේවා වගා

කිරීම හුරුපුරුදු වීමට ආදර්ශ ගොවිපලවල් 4–5 ක් හැම ජන්ද කොට්ඨාශයකම පිහිටුවීමට කටයුතු සලස්වා ඇත. එක ගොවිපලක් අක්කර 5 ක් තරම් විශාල වේ. මේ ආදර්ශන වලින් ගොවීන් පැල වගා කිරීම හා පවත්වා ගැනීම පිළිබඳ දැනුම පමණක් නොව, විවිධ තත්වයේ වගාවන් පවතින ඉඩම්වලින් ලැබෙන ආදායම් සංසන්දනය කර බලා අතුරු වගාවල වාසිදායක තත්වය පිළිබඳ තරුණු අවබෝධ කර ගැනීමට අවකාශ සැලැස්වීමට ද බලාපොරොත්තු වේ.

කුළු බඩු වගාව මෙරට අළුත් දෙයක් නොව, ඒවා අප මුතුන් මිත්තන් විසින් ද වගා කරන ලද බෝග වේ. මේවා අත්හැර තේ, රබර්, වගාවට යොමු වුනේ බ්‍රිතාන්‍ය ආණ්ඩු කාලයේ යැයි කිව හැකි ය. දැන් ලෝකයේ පවතින කෝපි, ගම්මිරිස්, කරාබු, සාදික්කා වලට ඇති විශාල ඉල්ලුම හා ඉහළ මිලෙන් ලද හැකි ලාභ ප්‍රයෝජන අප රට ගොවීන්ටත් ලබා ගැනීමට ඉඩ සලස්වන මෙම වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීම ඉතාම වැදගත් මෙහෙයක් හැටියට අප සලකන්නෙමු.

සත්ව නිෂ්පාදනය හා සත්ව සෞඛ්‍යය.

ඩබ්ලිව්.ජේ.එම්. ප්‍රනාන්දු මහතා, පශු වෛද්‍ය නිලධාරී, පන්නල.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පශු වෛද්‍ය කොට්ඨාශ 10 ක් තිබේ. මෙම කොට්ඨාශවලින් ඉතාම අඩු නිලධාරීන් සංඛ්‍යාවක් නියුක්ත වන්නේ පන්නල කොට්ඨාශයේ ය. පන්නල කොට්ඨාශයේ සිටින ව්‍යාප්ති නිලධාරීන් තුන් දෙනා ගෙන් එක් අයෙක් කෘත්‍රිම සිංචන කටයුතුවල නිරත වන අතර, අනෙක් දෙන්නා සෞඛ්‍ය හා ව්‍යාප්ති කටයුතුවල නිරත වේ. සත්ව පාලනය සාකච්ඡා කරන විට කොටස් තුනක් සඳහන් කළයුතු ය. සත්ව සෞඛ්‍යය, ව්‍යාප්තිය, අභිජනනය මේ කොටස් තුන ය.

සත්ව සෞඛ්‍යය : රෝග වලක්වා ගැනීමට උපදෙස් දීම, අසනීප වූ සතුනට ප්‍රතිකාර කිරීම, සතුන් එන්නත් කිරීම, සතුන් ගේ පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත් වීම මේ යටතේ කරනු ලැබේ.

ව්‍යාප්ති කටයුතු : කිරි එළදෙනුන්, ඌරන් සහ කුකුළන් ඇති කිරීමට අදාළව ගව පට්ටි, ඌරු කුකුල් කොටු තැනීම, ආහාර සැපයීම යනාදිය පිළිබඳව උපදෙස් දීම කරනු ලැබේ. මෙයට අමතරව කිරි මණ්ඩලයට කිරි සැපයීමට ලියා පදිංචි වීමටත්, කුකුල් පට්ටිකරුවන් උදෙසා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලයේ පත්වාහාර ලබා ගැනීමටත් සහ බැංකු මගින් සත්ව පාලන කටයුතුවලට ණය ලබා ගැනීම උදෙසාත් අවශ්‍ය සහතික නිකුත් කිරීමට ද කටයුතු කෙරේ.

**අභිජනනය** : කෘත්‍රිම සිංචනය, කෘත්‍රිම සිංචනය කරනු ලබන එළදෙනුන් ගේ ගැබ් පරීක්ෂණය, ගැබ් නොගන්නා එළදෙනුන් පරීක්ෂා කර බලා වඳ භාවයට ප්‍රතිකාර කිරීම, ප්‍රයෝජනයට නොසුදුසු ගවයන් ගේ කරඇඹීම, අප විසින් සිදු කරනු ලබන කටයුතු ය.

පොල් ඉඩම් පුනරුත්ථාපනය.

පී.එම්. පියරත්න මහතා, පොල් සංවර්ධන නිලධාරී, යක්විල.

පොල් වගා මණ්ඩලය එහි සහනාධාර ක්‍රමය මගින් පොල් වගාවන් පුනරුත්ථාපනය කිරීමෙහි යෙදී සිටී. මේ වැඩ පිළිවෙළ යටතේ පස සංරක්ෂණය කිරීමට ප්‍රමුඛතාවය දී තිබේ. පස සෝදා යෑම වැලැක්වීම සමෝච්ච කාණු කැපීම සිද්ධ කෙරේ. මේ සමෝච්ච කාණු කැපීමේ දී තද පස ඇති ඉඩම්වලට රු.24.00 කුත්, සාමාන්‍ය මැටි සහිත පසක් ඇති ඉඩම්වලට රු.20.00 කුත් වැලි සහිත පස ඇති ඉඩම්වලට රු.15.00 කුත් අඩිවැලක් උදෙසා ගෙවනු ලැබේ. තවද, උල්දිය සහිත ඉඩම්වල පිහිටි පොල් වගාව ඒ තත්වයෙන් මුදා ගැනීමට වැඩි ජලය ඉවත් කිරීමට සපන කාණුවල සෑම අඩිවැලකට රු.10.00 ක මුදලක් ගෙවීම ඉක්මනින් ආරම්භ කරනු ලැබේ.

දැනට රටේ පොල් ඉඩම්වල නොයෙකුත් ආකාරයට පොල් පැල සිටුවීම සිද්ධ කෙරේ. පොල් පර්යේෂණාගාරයේ නිර්දේශ අනුව අක්කරයකට පොල් පැල 64 ක් සිටු විය යුතු ය. මේ සංඛ්‍යාවට අඩු පොල් ගස් ප්‍රමාණයක් ඇති ඉඩම්වල අඩු පිරවීම පිණිස සිටුවන සෑම පොල් පැල යකට රු.2.50 ක සහනාධාරයක් ද, ඒ ප්‍රමාණයට වඩා පොල් ගස් ඇති ඉඩම්වල වැඩිපුර ඇති ගස් කපා ඉවත් කිරීමට ගසකට රු.18.00 ක උපරිමය දක්වා ද වූ සහනාධාරයක් ගෙවනු ලැබේ.

පොල් ගසකින් ආර්ථිකමය ඵලදාවක් ලබා ගත හැක්කේ අවුරුදු 60 ක් පමණ වන තෙක් ය. මෙවැනි වයස්ගත ගස් ඇති ඉඩම්වල ගස් යට නැවත පොල් වග වක් දැමීමට අක්කරයකට රුපියල් 1,800.00 ක මුදලක් ගෙවනු ලැබේ. මේ සහනාධාරය ලබා ගැනීමේ එක් කොන්දේසියක් වන්නේ අඩි 26X26 පරතරයට පොල් ගස් 64 ක් සිද්ධ විය යුතු බව ය. එයින් අනතුරුව වාරික පහකින් එම සහනාධාරය ගෙවනු ලැ බේ. තවත් සහනාධාර ක්‍රමයක් නම් ඵල ප්‍රයෝජනයක් නොමැති, කණාටු වී ගිය වගාවන් සම්පූර්ණයෙන් කපා ඉවත් කර පොල් පැල සිටුවීම උදෙසා දෙන නැවත වගා සහනාධාරය ය. මේ සඳහා ගෙවනු ලබන මුදල රු.1,700 කි. අළුත් එනම් මුඩු ඉඩම්වල පොල් පැල සිටු වීමට රු.2,200 ක සහනාධාරයක් ද ඇත.

පොල් ඉඩම්වල වෙනත් අතුරු භෝග වගා කිරීමට තවත් සහනාධාර ක්‍රමයක් ඇත. අවුරුදු 25–30 වයස් වූ පොල් වගාවක් සහිත ඉඩම් මේ බෝග වගා ඇරඹීමට සුදුසු ය. කෝපි, ගම්මිරිස්, කොකෝවා, වැනි භෝග මේ අන්දමින් වගා කිරීමෙන් පොල් වගාවට අවුරුදු 60 වන තෙක් පල ප්‍රයෝජනය ගත හැක. පොල් ඉඩම්වල කිරි පට්ටි පාලනය කිරීම උදෙසා තණ වැවීමට අක්කරයකට රු.300.00 ක සහනාධාරයක් ගෙවනු ලැබේ.

තවද, අක්කර 1/4 ත් 1/2 ත් අතර වූ ඉඩම්වල පොල් පැල 10 ක් දක්වා ප්‍රමාණයක් සිටුවීම සඳහා රු.23.00 බැගින් වූ සහනාධාරයක් ද පොල් ඉඩම්වලට පෝර යෙදීම සම්බන්ධව ලංකා බැංකුවත් කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියත් සහ පොල් සංවර්ධන අධිකාරියත් සම්බන්ධ වී

ඇති ණය ක්‍රමයක් ද දැනට ක්‍රියාත්මක කෙරේ.

කටුගම්පල මැතිවරණ කොට්ඨාශයේ පොල් අක්කර 49,000 ක පමණ තිබේ. පොල් සංවර්ධන මණ්ඩලය, ගටන්ගල්ල, යක්විල, වෙල්පල්ල යන පොල් සංවර්ධන නිලධාරි කොට්ඨාශ තුනක් යටතේ මෙම සහනාධාර කටයුතු සංවිධානය කර ඇත. මේ සඳහා ඉල්ලුම් පත්‍ර වගා නිලධාරී මහතුන් ගේ මාර්ගයෙන් අප භාර ගනු ලබන අතර, මෙම ඉල්ලුම් පත්‍ර අනුව අප කලින් දිනයක් නියම කර ගෙන ඉල්ලුම්කරු ගේ ඉඩම පරීක්ෂා කර බැලීමට කටයුතු කරන්නෙමු.

තවද, සමෝච්ජ කාණු යනාදිය ලකුණු කිරීමට අප දැනටමත් මේ ප්‍රදේශයේ තරුණයින් පුහුණු කර තිබෙන අතර, මේ සඳහා සමෝච්ජ කාණු ලකුණු කිරීමට අක්කර එකකට රු.5.00 කුත්, පොල් පැල පේලි ලකුණු කිරීමට අක්කර එකකට රු.6.50 කුත් අය කර ගැනීම ඔවුනට අවසර දී තිබේ.

ගොවි නිෂ්පාදන අලෙවිය.

ආරියරත්න ගුණසිංහ මහතා, අලෙවි සංවර්ධන සහකාර කොමසාරිස්, කුරුණෑගල.

ගොවි නිෂ්පාදන අලෙවි කිරීමේ දී විවිධාකාර ප්‍රශ්න ඇත. එළවළු වගා කරන්නන්ට තම නිෂ්පාදන වලට හොඳ මිලක් ලබා ගැනීමට ඉඩ සැලැස්වීමත්, ඒටහේ ම එළවළු මිළ දී ගන්නා පාරිභෝගික යින්ට සාධාරණ මිළකට එම නිෂ්පාදන ලබා ගැනීමට ඉඩ සැලැස්වීමත්, මෙහි දී අප ගේ උත්සාහය වේ. අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව මුල දී අදහස් කලේ එළවළු නිෂ්පාදන මිළ දී ගැනීමට කටයුතු කිරීම පමණක් වුව ද, දැන් පළතුරු හා ධාන්‍ය මිළ දී ගැනීම කෙරෙහි ද එහි-තව කටයුතු ව්‍යාප්ත කර තිබේ.

අත්පිට මුදලට එළවළු මිළ දී ගැනීම උදෙසා අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවට ඇති පහසුකම් සීමිත ය. ඊට හේතු වන්නේ මිළ දී ගන්නා එළවළු පාරිභෝගිකයින්ට අලෙවි කිරීමට දෙපාර්ත මේන්තුවට ඇති සීමා ය. කෙසේ වුව ද, දැන් අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව සතු සිල්ලර වෙළඳ සැල් සංඛ්‍යාව 250 දක්වා වැඩි කිරීම නිසා දැන් කලින් ප්‍රමාණය මෙන් දෙගුණයක් එළවළු ගොවීන් ගෙන් මිළ දී ගනු ලැබේ.

කොළඹ නගරවාසී පාරිභෝගිකයනට අවශ්‍ය එළවළු මිළ දී ගැනීමට අලෙවි සංවර්ධන දෙපාර්තමේන් තුව කටයුතු කරයි. මේ සඳහා බෞද්ධාලෝක මාවතේ ජාතික පොළේත්, මරදානේ ට්‍රිපොලි වෙළඳ සැලේත්, එළවළු එක් රැස් කරන මධ්‍යස්ථාන දෙපාර්තමේන්තුව මගින් පිහිටුවා තිබේ. දිව යින පුරා පිහිටි අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේ එළවළු රැස් කරන මධ්‍යස්ථානවලින් එළවළු සැපයෙන්නේ මේ ස්ථාන දෙකට ය. කෙසේ වුව ද, දැන් ඔය පළාත් වල දෙපාර්තමේන්තුවේ මහජන වෙළඳ සැල් ගණන වැඩි කර ඇති නිසා අගනුවරට අවශ්‍ය ප්‍රමාණයට වඩා අතිරික්තයක් ඇත්නම් ඒවා එම වෙළඳ සැල්වලට බෙදා හරිනු ලැබේ. කෙසේ වුව ද, සීමිත එළවළු ප්‍රමාණ යක් අත්පිට මිළට ගැනීමෙන් එළවළු නිෂ්පාදනය හා අලෙවිය කෙරෙහි වැදගත් බලපෑමක් ඇති

කළ හැකි යයි කිව නොහැකි ය.

මැත දී දෙපාර්තමේන්තුව තවත් තොග වෙළඳ පොලවල් දෙකක් සෝන්ඩර්ස් පෙදෙසේත්, යාපනය නගරයේත් පිහිටුවීමට කටයුතු කර ඇත. දැන් ඕනෑම ගොවි මහතෙකුට මෙම මධ්‍යස්ථානවලට සීමාවක් නැතිව එළවළු යැවීමට කටයුතු කළ හැකි ය. මේ සඳහා අය කරන කොමිස් මුදල (ප්‍රවාහන ගාස්තුව ඇතුළුව 7% ක් වේ.)

කටුගම්පල ආසනයේ අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රධාන කොටස් තුනකට බෙදා දැක්විය හැකි ය. (අ) එළවළු රැස් කරන මධ්‍යස්ථාන (ආ) මහජන වෙළඳ සැල් (ඇ) රෝහල් සැපයීම් සේවාවන්.

කටුගම්පල ආසනයේ පිහිටි පන්නල හා සඳලංකාව එළවළු එක් රැස් කරන මධ්‍යස්ථානවල සඳුදා, බදාදා, සහ සිකුරාදා යන දිනවල මිල දී ගැනීම් කෙරේ. මේ ප්‍රදේශවල දෙපාර්තමේන්තුවේ මහජන වෙළඳ සැල් නිෂ්පාදකයින් ගෙන් එළවළු මිළ දී ගන්නවා මෙන් ම ප්‍රදේශයේ වගා නොකරන ගොවි නිෂ්පාදන වෙනත් ප්‍රදේශවලින් ගෙනවුත් පාරිභෝගිකයනට අලෙවි කිරීම සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුව මගින් පිහිටුවා ඇති රෝහල් සැපයීමේ මධ්‍යස්ථාන මගින් රෝහල්වලට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය සෑම එකක්ම පාහේ සැපයීමට දැන් කටයුතු කෙරේ. මේ හේතුව නිසා එක් රෝගියෙකුට උවමනා වන මේ ආහාර ද්‍රව්‍ය වල වටිනාකම රු.2.82 ක් පමණ වූ අඩු මුදලකි. පිටස්තර පුද්ගලයින් විසින් මේ කාර්ය සිදු කරන්නේ නම් ඒ සඳහා බෙහෙවින් විශාල මුදලක් වියදම් කිරීමට සිදු වනු ඇත.

එළවළු මිළ දී ගැනීමේ දී අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවට පෞද්ගලික වෙළඳ මහතුන් සමඟ සෑහෙන තරඟයක යෙදෙන්නට සිදු වී ඇත. එක් එක් දිනක එළවළු මිළ දී ගන්නා මිළ ගුවන් විදුලිය මගින් නිවේදනය කරයි. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එම මිළ ගණන්වලට වඩා ඉහළ මිළ ගණන් ගෙවා මිළ දී ගැනීමට අවසර නැත. එම මිළට වඩා අඩුවෙන් මිළ ගෙවුවහොත් ඔවුනට විරුද්ධව නීති මගින් කටයුතු කරන්න ගොවි මහත්වරුන් හට බලය තිබේ. තත්වය මෙසේ පවතිද්දී පෞද්ගලික වෙළඳුන් නොයෙක් උපක්‍රම උපයෝගී කර ගනිමින් වඩාත් තරඟකාරී ලෙස එළවළු මිළ දී ගැනීමට කටයුතු කරති. කෙසේ උනත් එක අතකින් දෙපාර්තමේන්තුවේ අභිප්‍රාය සාධාරණ ලාභයක් ලැබීම පමණක් නොව, නිෂ්පාදකයාට ද පාරිභෝගිකයාට ද, සාධාරණ වන මිළ ගණන් පවත්වා ගැනීම කෙරෙහි බලපෑමක් ඇති කරවීම නිසා දෙපාර්තමේන්තු සේවාවන් එළවළු මිළ කෙරෙහි ඇති කෙරෙන බලපෑම වැදගත් සේවයක් හැටියට සැලකීමට පුළුවන.

ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම එළවළු නිෂ්පාදකයින් ගේ සමිති පිහිටුවීමට කටයුතු කර ගෙන යනු ලැබේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිට වූ මෙම සමිතිවල පළමුවැන්න කුලියාපිටිය ආසනයේ කිරිඳි වල පිහිටුවා තිබේ. මේ සමිති ගොවීනට අවශ්‍ය බීජ, පෝර, ණයට ලබා දේ. මෙයට අමතරව ගොවි ප්‍රශ්න මොනවා ද යන්න සොයා බලා රට පිළියම් යෙදීමට රජයේ දෙපාර්තමේන්තු

වලට පහසු වන්නේ එක් එක් පුද්ගලයෙකු හා කටයුතු කිරීම වෙනුවට සමූහයක් සමඟ කටයුතු කිරීම පහසු වන බැවිනි.

සමිතියට මුහුණ පෑන්නට සිදු වන ප්‍රධාන ප්‍රශ්න වලින් එකක් වන යෙදවුම් සහ නිෂ්පාදන ප්‍රවාහනයට පහසුකම් සලස්වා ගැනීමට දැන් අළෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව වැඩ පිළිවෙළක් සකස් කර තිබේ.

බැංකු සේවා.

ඩබ්ලිව්.ඒ.ර. තියෝ පිලයි මහතා, කළමණාකරු, ලංකා බැංකුව, කුලියාපිටිය.

සංවර්ධන කටයුතු සිදු කිරීමේ දී බැංකු ණය අත්‍යාවශ්‍ය දෙයකි. බැංකු සංවර්ධන කටයුතුවලට සම්බන්ධ වන්නේ මේ ණය ලබා දීම සම්බන්ධයෙනි. මේ ප්‍රදේශයේ ප්‍රධානතම ආර්ථික කාර්යය පොල් වගා අංශයේ කටයුතු ය. පොල් වගාව සම්බන්ධ ණය ක්‍රමය ක්‍රියාත්මක වන්නේ අංශ දෙකිනි. පොල් ඉඩම්වල සමෝච්ඡ පේළි කාණු කැපීමේ දී ශාල් වගා මණ්ඩලයේ සහනාධාර ලැබෙන්නේ කාණු කපා අවසාන වූවායින් පසුව ය. එම නිසා ඒ කටයුතු කර ගෙන යාමට සහනාධාර මුදල් ලැබෙන තුරු යම් යම් වියදම් දැරීමට අවශ්‍ය වේ. එසේ අවශ්‍ය වියදම් ණයක් හැටියට දීමට ලංකා බැංකුවේ වැඩ පිළිවෙළක් සකස් කර ඇත. මේ ණය කටයුතු සම්බන්ධ ගොවි මහතුන් හා බැංකු අතර සම්බන්ධීකරණය සිදු කරන්නේ කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ ජන්ද කොට්ඨාශය භාර කළමණාකර තැන යි. ගොවි මහත්වරුන් තමන් ගේ එබඳු ණය අවශ්‍යතාවයන් වගා නිලධාරීන් ගේ මාර්ගයෙන් ඔහුට දන්වා ලීමෙන් මේ ණය ලබා ගැනීමට කටයුතු කළ හැකි ය.

දැනට අවුරුදු 10 ක පමණ කාලයක් තිස්සේ පොල් වගාව නොසලකා හැර තිබූ වගාවකි. ඒ හේතුවෙන් පොල් නිෂ්පාදන අඩු වී යාම නිසා දේශීය වෙළඳ පොලේ පොල්වල මිළ ඉහළ යාම ද පිටරට යැවීමට තිබූ ශාල් නිෂ්පාදනවල ප්‍රමාණය පහළ බැසීම නිසා ඉන් ඉපයූ විදේශ විනිමය ප්‍රමාණය ද පහත වැටී ඇත. මේ තත්වය ලංකා බැංකුව මගින් පෝර ණය ක්‍රමයක් කුලියාපිටිය ආසනයේ ක්‍රියාත්මක කිරීමට හේතු වී ඇත. බිංගිරිය, පඩුවස්නුවර, සහ කටුගම්පල යන ආසන මෙම ණය ක්‍රමයෙන් ආවරණය කිරීමට බලාපොරොත්තු වේ.

බැංකු සේවාවන් පුළුල් කිරීම උදෙසා ළඟදීම ලංකා බැංකුව පන්තල බැංකු ශාඛාවක් විවෘත කෙරෙන අතර, එය යටතේ හමන්ගල්ල, සක්විල සහ වෙල්පල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානවල බැංකු ශාඛා විවෘත කෙරෙනු ඇත. දැන් මේ හැම පහසුකමක් ම සැලසී ඇති නිසා වගා නිලධාරීන් මේ ණය ක්‍රමය ගැන ගම්වල උනන්දුව ඇති කර ප්‍රදේශයේ හැම පොල් ගසකටම පෝර යෙදීමට කටයුතු කරන්නේ නම් ආර්ථික ප්‍රශ්න විසඳා ලීමට එය ප්‍රයෝජනවත් පියවරක් වනු ඇත.

ලෝක බැංකුවේ සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ රුපියල් කෝටි පහක් පමණ මූල ධනයක් මෙම කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැය කිරීමට යෝජනා කර තිබේ. මෙම ණය අපට ලබා ගැනීමට ඔවුන්



22185

දී තිබූ එක කොන්දේසියක් වූයේ මෙසෙක් ගොවි මහත්වරුන්ට දී ඇති වගා ණය ආපසු ලබා ගැනීම කළයුතු බව ය. මෙසේ හැම මසකට වරක් දී ඇති වගා ණය වලින් ආපසු ලබා ගත් ණය මුදල් ප්‍රමාණය පිළිබඳ තොරතුරු ලෝක බැංකුවට වාර්තා කළයුතු ය. මෙම මුදල් ගෙවන්නේ නැතිව තිබීම රටේ නොයෙකුත් මූල්‍යමය ප්‍රශ්න පැන නැඟීමට හේතු වී තිබේ. ඉතා පැහැදිලිව පෙනෙන කරුණක් නම් උද්ධමනය වැඩි වී බඩු මිල ඉහළ යාම ය. එය විශේෂයෙන් වගා ණය මුදල් පාරිභෝගික භාණ්ඩවලට වැය කිරීම නිසා සිදුව තිබේ.

ගොවි මහත්වරුන්ට අවශ්‍ය වතුර පොම්ප, දියර ඉසින යන්ත්‍ර යනාදිය ලබා ගැනීමට ණය ක්‍රමයක් කටුගම්පල ආසනයේ දී ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇත. මෙබඳු ණය යෝජනා ක්‍රමයක් දැනට මත් කුලියාපිටිය ආසනයේ ක්‍රියාත්මක වේ. මේ ණය දීම සම්බන්ධව මතු වී ඇති ප්‍රධාන බාධකය වන්නේ වගා ණය ආපසු ගෙවා නොමැති ගොවීන් හට මේ ණය ලබා ගත නොහැකි වීම ය. මේ ණය ලබා ගැනීමේ දී ඇප කරුවන් හැටියට බැංකුව බලාපොරොත්තු වන්නේ වගා ණය ගෙවා ඇති ගොවි මහතුන් දෙපොළක් පමණ ය. මෙය ක්‍රියාත්මක කෙරෙන්නේ කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව ය.

පොල් වගා ණය යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයන් හැටියට ණය දෙනවාට වඩා පුද්ගලයන් සංවිධානය කර ණය ලබා දීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නට අදහස් කර ඇත. මේ අන්දමේ ණය ක්‍රම තායිවානයේ සහ ජපානය යන රටවල සාර්ථක ලෙස ක්‍රියාත්මක කර තිබේ. ඒ ක්‍රම ආදර්ශයට ගෙන මෙරටට සුදුසු ණය ක්‍රමයක් සකස් කර ගැනීමට හැකි ය. මෙහි දී මෙම ණය ක්‍රම සංවිධානය කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම ගැන ආසනයේ කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ කළමණාකරුත්, වගා නිලධාරී මහතුනුත්, ඒවගේ ම කොට්ඨාශයේ ඉඩම් හිමියනුත් එක්ව කටයුතු සංවිධානය කිරීම වැදගත් වේ. මේ ණය යෝජනා ක්‍රමය යටතේ පළමු වෙනි අවුරුද්දේ දී ණය ගෙවීමක් කිරීමට ගොවීන්ට සිදු වන්නේ නැත. ඉන් වන අවුරුද්දේ පටන් මාස දෙකෙන් දෙකට නියම වන වාරික වලින් මෙම ණය මුදල ගෙවා අවසන් කළයුතු වේ.

ආරියපාල මහතා, කළමණාකරු, මහජන බැංකුව,

මහජන බැංකුව වගා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන්නේ සමූපකාර සමිතිවල, ග්‍රාමීය බැංකු මගිනි. සමූපකාරයේ ප්‍රාදේශික හැම ගමකම පිහිටුවා තිබේ. මේ ප්‍රාදේශික මගින් ග්‍රාමීය බැංකු වේ කටයුතු හැම ගමකම පාහේ ව්‍යාප්ත කර ඇත. ගොවි මහතුන් ද හැම කෙනෙක්ම වාගේ සමූපකා ර සමිතියක සාමාජිකයන් ය. කුලියාපිටිය සහ කටුගම්පල ආසනවල මේ අන්දමට සමිති වලට සම්බන්ධ වී කටයුතු කරන ගොවි පිරිස හැටදාහක් පමණ වේ.

කෘෂිකාර්මික කටයුතු සඳහා ණය යෝජනා ක්‍රම මහජන බැංකුව ආරම්භ කලේ 1967 දී ය. ඊට පෙර ඒ කටයුතු කලේ නොයෙකුත් දෙපාර්තමේන්තු මගින් ය. 1977/78 වන විට මේ අන්දමට මහජන බැංකුව රුපියල් කෝටි 3 1/2 ක් පමණ (දශ ලක්ෂ 330 ක්) වගා ණය දී තිබේ. කෙසේ වූවත් මේ මුදලින් ආපසු ගෙවා ඇත්තේ 10% ක මුදලක් පමණි.

මේ අන්දමට දිගින් දිගටම ණය දීමට බැංකුවට හැකියාවක් නොමැත. එක් අතකින් බලන විට ගොවි මහත්වරු මේ වගා ණය ආපසු නොගෙවන දෙයක් හැටියට සැලකීමට ඇබ්බැහි වී ඇති බවක් ද, පෙනී යයි. පසුගිය අවුරුදු 12 ඇතුළත මේ දිස්ත්‍රික්කයේ වගා ණය ආපසු නොගෙවූ ගොවි මහත්වරුන් ගේ සංඛ්‍යාව 30,000 ක් පමණ වේ. මෙයින් මහජන බැංකුවට වගා ණය නොගෙවූ සංඛ්‍යාව 25,000 ක් පමණ ද, ලංකා බැංකුවට වගා ණය නොගෙවූ සංඛ්‍යාව 5,000 ක් පමණ ද වේ. මේ ණය අය කර ගැනීමට දැන් නොයෙකුත් ක්‍රම අනුගමනය කෙරේ.

සමූපකාර ග්‍රාමීය බැංකුව දැන් ගොවි ජනතාව ගේ යහපත උදෙසා විස්තීර්ණ වගා ණය ක්‍රම ව්‍යාප්ත කර ගෙන යනු ලැබේ. මෙයට අමතරව පොල් සංවර්ධන මණ්ඩලයේ පොල් සහනාධාර ක්‍රමය, කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය මගින් වතුර පොම්ප, ස්ප්‍රේයර් යන්ත්‍ර සහ අනිකුත් ගොවි උපකරණ සැපයීම යනාදියට මහජන බැංකුව සහාය වනු ඇත.

කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ කාර්ය භාරය.

සිංහ පෙරේරා මහතා, වැඩ බලන තළවණාකාර, කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය, කටුගම්පල.

කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය යනු කුමක් ද? ඉන් බලාපොරොත්තු වන සේවාව කුමක් ද?

කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය කෘෂිකර්ම සංවර්ධන අංශයේ නොකෙරෙන වැඩ ඉටු කිරීම පමණක් නොව, කෙරෙන වැඩත් හරිහැටි ඉටු වන බවට වග බලා ගැනීම සිය කාර්ය භාරය කර ගනී. ගොවි ජනතාවට අවශ්‍ය සේවාවන් සපයා දීමට දැනට විවිධ ආයතන, දෙපාර්තමේන්තු, යනාදියෙන් සිදු කෙරේ. මේවාහි කටයුතු කරන නිලධාරීන් සමඟ සහෝදරත්වයෙන් සාකච්ඡා මාර්ගයෙන් හා අවශ්‍ය ක්‍රියාකාරී භාවයෙන් ඒ විවිධ ආයතන, දෙපාර්තමේන්තුවල කටයුතුවල සම්බන්ධීකරණයක් ඇති කිරීම ඒ උත්සාහයන් වල සාර්ථක ඵල ලබා ගැනීමට ඉතා වැදගත් කාර්යයකි.

කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය මගින් ඉටු කරන සම්බන්ධීකරණ කටයුතු පිළිබඳ අවබෝධයක් ලබා දීමට මා සේවය කරන කුලියාපිටිය ආසනයේ කටයුතු ගැන හැඳින්වීමක් කිරීම මැනවැයි අදහස් කරමි. පළමුවෙන් ම මෙම ආයතනයේ කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය, ලංකා බැංකුවේ සහාය ඇතිව ගොවීනට වතුර පොම්ප ලබා දීම උදෙසා රුපියල් ලක්ෂ 10 ක ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇත. මේ ණය ලබා දෙන්නේ ලිහිල් ඇපකරුවන් ඇතිව ය. ඒ සඳහා ලංකා බැංකුව බලාපොරොත්තු වන්නේ සමාජය පිළිගත හැකි, වංචනික නොවන, වගා ණය නිසි පරිදි ගෙවා ඇති පුද්ගලයෙකු පමණ ය. එපමණක් ද නොව, මේ යටතේ දෙනු ලබන ණය අඩක් වන තෙක් නිසි පරිදි ආපසු ගෙවා ඇත්නම් ඒ පුද්ගලයන්ට නැවතණයක් ලබා දීමට වුව ද, බැංකුව සූදානම් ය. මේ යෝජනා ක්‍රමය ගොවීන් හා සම්බන්ධව කර වන්නේ කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය යි. මේ යෝජනා ක්‍රමයට සම්බන්ධ කිරීමට සුදුසු ගොවි මහතුන් අප තෝරා ගන්නේ වගා නිලධාරීන් ගේ මාර්ගයෙනි. මෙහි දී දේශපාලන නැඹියාවක් සලකන්නේ නැත. එහි දී දක්ෂ ගොවියෙකු වීමත් හා බැංකු ගනු දෙනු සම්බන්ධව පිරිසුදු වාර්තාවක් තිබීමත් පමණක් අත්‍යවශ්‍ය කරුණු යි.

කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය අදාළ සමාගම් සමඟ සාකච්ඡා කර මෙම යෝජනා ක්‍රමය යටතේ පොම්ප, ස්ප්‍රේයර් යන්ත්‍ර සහ නල විශේෂ මිලකට කෙලින් ම ගොවි මහත්වරුන්ට ලබා ගැනීමට කටයුතු සලස්වා ඇත. මේ හේතුවෙන් වතුර පොම්ප මිල දී ගැනීමේ දී ගොවි මහතෙකුට රු.150.00 ක වාසියක් අත් වෙන අතර, ස්ප්‍රේයර් යන්ත්‍ර මිළ දී ගැනීමේ දී රු.300.00 ක පමණ මිල අඩු කිරීමක් ද, අඟල් දෙකේ බට මිළ දී ගැනීමේ දී අඩියකට ශත 65 ක පමණ මිල අඩු කිරීමක් ද සිදු කෙරේ. මේ සඳහා අවශ්‍ය වන්නේ ඒ ඒ සමාගම්වලට කෘෂිකර්ම සංවර්ධන අධිකාරියෙන් ලිපියක් රැගෙන යාම පමණි.

මේ අන්දමට කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය කටයුතු සම්බන්ධීකරණය සිදු කරන තවත් අංශයක් නම් පොල් වගා සහනාධාර ක්‍රම ය. 1972 සිට වූ ලැබූ පොල් වගා කිරීමේ මණ්ඩලයට විශාල වගකීම් භාරයක් පවරා තිබේ. මේ වගකීම් සියල්ල සපුරා ලීම එම මණ්ඩලයට පමණක් කිරීම අපහසු දෙයකි. උදාහරණයක් හැටියට කටුගම්පල ආසනයේ තත්වය දක්වා ලිය හැකි ය. මෙම ආසනය තුළ පොල් සංවර්ධන නිලධාරීන් තිදෙනෙක් සිටී. ඔවුන් තිදෙනා ආසනය තුළ තිබෙන පොල් ඉඩම් අක්කර 49,000 ක සංවර්ධන කටයුතු ඉටු කළයුතු යි. මෙහි කුඩා පොල් ඉඩම් හිමියන් විශාල සංඛ්‍යාවක් සිටී. ඔවුන් සියල්ලගේ ඉල්ලීම් ශීඝ්‍රයෙන් සපුරා ලීමට හැකියාවක් මේ තුන් දෙනා සතුව නැති බැව් පැහැදිලි ය. මෙතන දී ප්‍රශ්නයක් වන්නේ මේ ඉඩම් හිමියන් තනි තනිව ඔවුන් ගේ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට යාම ය. **මුදල්** හදල් ඇති අයට නම් තනි තනිව ඔවුන් ගේ අවශ්‍යතා ඉටු කර ගැනීම ප්‍රශ්නයක් නොවේ. නමුත් වැඩිදෙනා එසේ කටයුතු කර ගත නොහැකි අය ය. මෙහි දී අප ගොවීන් සංවිධානයක් යටතට ගෙනැවිත් ඔවුන් ගේ අවශ්‍යතාවය එකතු කර මේ සහනාධාර ලබා ගන්න සලස්වනවා නම් එක දිනක දී එක නිලධාරී මහතෙකුට ගොවීන් 30-40 ක අවශ්‍යතා ඉටු කර දිය හැකි ය. කුලියාපිටිය ආසනයේ මේ අන්දමට ගොවීන් සංවිධානය කිරීමේ ඉතාමත් සාර්ථක ප්‍රතිඵල ලබා ගෙන තිබේ. එම ආසනයේ පොල් වගා සහනාධාර වශයෙන් රු.66,000 ක් අපට ලබා දිය හැකි වූවත්, එබඳු සංවිධානයක් නොමැති කටුගම්පල ආසනයේ ඒ වකවානුවේ දී සහනාධාර ලබා දිය හැකි වූයේ රු.6,500 ක් පමණ ය. එමනිසා එබඳු සංවිධාන ක්‍රමයක් මෙම ආසනය තුළ ද ඇති කර ගැනීමට වගා නිලධාරීන් උනන්දු විය යුතු වැදගත් කරුණකි.

සවස් භාගය.

සම්මේලනයේ පරමාර්ථ.

ටී.බී. සුබසිංහ මහතා, අධ්‍යක්ෂ, ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

මෙම සම්මේලනය පැවැත්වීමට කරුණු රාශියක් හේතු වී තිබේ. 1975/76 වර්ෂවල දී ද මෙවැනි ගොවි සම්මේලන දිස්ත්‍රික්ක හතරක පැවැත්වීමට යෙදුනෙමු. ගාල්ල, යාපනය, මඩකලපුව හා මහ නුවර එම දිස්ත්‍රික්ක වේ. එම ගොවි සම්මේලනවල කටයුතු පසුව ප්‍රකාශන හැටියට පළ කර බෙදා හරින ලදී. එහි දී ගත් සමහරක් තීරණ එම අවස්ථාවේ දී ම ක්‍රියාත්මක කිරීමට පියවර ගත් අතර තවත් ඒවා එබඳු තීරණ ගන්නා උදවියට ඉදිරිපත් කරන්නට යෙදුනෙමු. මේ අනුව මෙවැනි ගොවි සමුළු වලින් ඇති ප්‍රයෝජන ඉමහත් යයි පෙන්වා දිය හැකි ය.

එහි දී අපට පෙනී ගිය කරුණක් වූයේ දිස්ත්‍රික්ක මට්ටමින් ගොවි සම්මේලන පැවැත් වීමෙන් ඒවාට සහභාගි වීමට ලැබෙන්නේ ගොවි මහතුන් ස්වල්ප දෙනෙකුට පමණක් බව යි. මේ නිසා එම සම්මේලන ඡන්ද කොට්ඨාශ මට්ටමින් පැවැත් වීමට දැන් තීරණය කළෙමු.

ලෝක බැංකුවේ ආධාර ක්‍රමයක් මගින් ඒකාබද්ධ සංවර්ධන වැඩ පිළිවෙලක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැන් ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව දිස්ත්‍රික්කයේ වැදගත්කම නිසාත්, දිසා ඇමතිතුමා ගේ උනන්දුව නිසාත්, මෙම දිස්ත්‍රික්කයේ දිසා ඇමතිතුමා නියෝජනය කරන කටුගම්පල ආසනයේ දී මෙම සම්මේලනවල දෙවන වටයේ පළමුවැන්න මෙසේ පැවැත්වීමට අප අදහස් කෙළෙමු.

මෙම සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ විදේශාධාර රුපියල් කෝටි 30ක් පමණ ද දේශීය ආයෝජන රුපියල් කෝටි 20 ක් පමණ ද වැය කිරීමට බලාපොරොත්තු වේ. මේ වැඩ පිළිවෙළ මගින් ප්‍රදේශයේ ඇති රක්ෂා හිඟය නැති කිරීමටත්, වී පොල් වැනි බෝගවල ඵලදායිතාවය වැඩි දියුණු කිරීමටත්, අදහස් කර ඇත. තවද, වාරිමාර්ග කටයුතු දියුණු කිරීම යටතේ සුළු වාරිමාර්ග ව්‍යාපාර 500 ක් හා මහ වැව් නවයක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදු කෙරෙනු ඇත. තවද, සැපයුම් සේවාවන් වැඩි දියුණුව, ගොවි සංවිධාන ශක්තිමත් කිරීම වැනි කටයුතු රැසක් සිදු කරනු ඇත.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවීන් ගෙන් 90% ක් වැඩි දියුණු වී භාවිතා කළත් ලබා ගන්නා සාමාන්‍ය අස්වැන්න වී බුසල් 40 ත් 45 ත් අතර වූ ප්‍රමාණයකි. මෙයට හේතුව පෝර යෙදීමත් අනෙක් යෙදවුම්වල අඩු බවත් නිසා විය හැකි ය. මෙම සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ අක්කරයකින් ලබා ගන්නා සාමාන්‍ය වී ප්‍රමාණය බුසල් 55 දක්වා වැඩි කර ලීමට බලාපොරොත්තු වේ. එමගින් දිස්ත්‍රික්කයේ දැනට මුළු වී නිෂ්පාදනය වන වී බුසල් ලක්ෂ 800, වී බුසල් ලක්ෂ 1,160 දක්වා වැඩි කරලීමට අපේක්ෂා කෙරේ. තවද, සුළු අපනයන බෝග අක්කර 8,000 ක් පමණ පොල් ඉඩම් යටගේ අළුතෙන් වගා කිරීමට ද අදහස් කර ඇත.

ගොවි ක්ෂේත්‍රයේ බීජ වර්ග වැඩි දියුණු කිරීම, ක්‍රමවත් ලෙස පොර භාවිතාව ආදී විද්‍යාත්මක තොරතුරු එක් පරියේෂණ අංශයකින් ද, ගොවි මහත්වරුන් ගේ සමාජ–ආර්ථික කරුණු ගැන සොයා බැලීම තවත් පර්යේෂණ අංශයකින් ද, සිදු කෙරේ. වැඩි දියුණු බිත්තර වී භාවිතාව ගැන සොයා බලන විට ඒ භාවිතා කරන ගොවි මහත්වරුනට ඇති නොයෙකුත් ප්‍රශ්න හෙළිදරව් වී ඇත. අද සොයා ගෙන තිබෙන කරුණු අනුව සමහර විට මේ හේතුවෙන් දුප්පත් ගොවියා තවත් දුප්පත් වන බව පෙනී ගොස් තිබේ. සහතික මිල වැඩි කිරීමෙන් ප්‍රයෝජනයක් ලැබෙන්නේ වී අතිරික්ත විකුණා ගන්නට තිබෙන ගොවීන් හට පමණ ය. යෙදවුම්වල මිල වැඩි කොළොත් සුළු ගොවි මහත්වරුන්ට තවත් පහර වැදීමට ඉඩ තිබේ. මෙවැනි ගොවි සම්මේලන රජයේ ප්‍රතිපත්ති සකසන මැති ඇමති වරුන්ටත් ඒවා ක්‍රියාත්මක කරන නිලධාරීන්ටත්, ගොවි මහත්වරුන්ටත් එකවුනු වී සාකච්ඡා කර මේ කරුණු තේරුම් කර ගෙන ඒ අනුව ප්‍රශ්නවලට සුදුසු විසඳුම් සොයා ගැනීමට ඉඩ සලස්වයි.

සාකච්ඡා වාරය.

<u>අයි.එම්. ගුණසේකර ගොවි මහතා.</u>

පහසුකම් තිබියදීත් කුඹුරු ගොවිතැන් කටයුතු ක්‍රමවත්ව නොකරන ගොවි මහතුන් ගැන ගත යුත්තේ කුමන ක්‍රියා මාර්ගයක් ද කියා දැන් තිබෙන නීති රීති වලින් පැහැදිලි නොවන නිසා ප්‍රශ්න ඇති වී තිබේ. මේ සම්බන්ධව ගන්නා ක්‍රියා මාර්ගය කුමක් ද?

<u>ගොවිජන සේවා සහකාර කොමසාරිස්, කුරුණෑගල.</u>

මේ තත්වය තවදුරටත් පැහැදිලි කර දීමට කැමතියි. එක වෙල් යායේ අක්කර 100 ක් තිබෙනවා යයි සිතමු. දැනට ඒ බිම් ප්‍රමාණයෙන් වගා වන්නේ අක්කර 70 ක් 80 ක් පමණ ය. කඩින් කඩ බිම් කට්ටි බොහෝ විට ගොවීන් වගා නොකිරීම රට හේතුව ය. යායේ කටයුතු එක අන්දමට සිදු නොවීම නිසා සිදු වන්නේ මහන්සි වී වැඩ කරන දක්ෂතම ගොවි මහතාට වුවත් තම උත්සාහයෙන් ප්‍රයෝජනයක් ලබා ගැනීමට ඇති ඉඩ ඇහිරී යාම ය.

විශේෂයෙන් වාරිමාර්ග අංශය පනත යටතේ පවත්වන කන්න රැස්වීම් වල දී වැට කඩොලු බැඳීම, වාරි ජලය පරිහරණය, ඇල වේලි සුද්ද කිරීම යනාදි හැම කටයුත්තක් සම්බන්ධව ගන්නා සාමූහික තීරණවලට එකඟ නොවන විදියට කටයුතු කරන අවස්ථාවල දී එම ගොවීන්ට විරුද්ධව ගත යුතු ක්‍රියා මාර්ගය කුමක් ද? යන්න පැහැදිලි කරවා ගැනීම එම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරේ. 1972 ට පෙර වාරිමාර්ග අංශය පනත ක්‍රියා කරන විට ගම් සභා උසාවි මගින් කටයුතු කිරීමට හැකි වුනි. යෝජිත ගොවිජන සේවා පනත මගින් නැවත මෙයට අවශ්‍ය නීතිමය පදනමක් ලැබීම වැදගත් කරුණකි.

<u>ගොවි මහතෙක්.</u>

කහ සහ ඉඟුරු පිටරටින් ගෙන්වීම නැවැත්වීම නිසා හොඳ මිලක් පැවති නමුත් ළඟදී එම තහනම ඉවත් කිරීම හේතු කොට ගෙන ඒවායේ මිළ ගණන් සීඝ්‍රයෙන් පහළ බැස තිබේ.

<u>රංජිත් විජේරත්න මහතා, ලේකම්, කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය.</u>

මෑත දී. ආහාර ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිපත්ති ගැන සොයා බලන්න කමිටුවක් අමාත්‍ය මණ්ඩලය මගින් පත් කර තිබේ. මෙම කමිටුව මාර්ගයෙන් කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය ක්‍රමානුකූලව මෙරට වගා කළ හැකි භෝග වර්ග මොනවා ද යන්න සොයා බලා ඒවාට ගැලපෙන පාදක මිලක් නියම කිරීමට අදහස් කර ඇත. මේ පාදක මිළ ඇති කෙරෙන්නේ ඒ ඒ වගාවලට යන සියළු ම වියදම් සම්බන්ධව සොයා බලා ය. එහි දී ගොවි මහතාට මේ මිළට ඉහළ ඕනෑම මිළකට පෞද්ගලික වෙළඳුන්ට විකුණා ගැනීමට හැකි ය. එසේ විකුණා ගැනීමේ අපහසුවක්

තිබෙනවා නම් ඒ හැම නිෂ්පාදනයක් ම රජයේ ආයතන මගින් පාදක මිළට මිල දී ගෙන පිටරට යැවීම උදෙසා කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමු.

ජේ.එම්. විල්බට් සිංඤෝ ගොවි මහතා.

වෙනත් බෝගවලට අලෙවි කිරීමේ හා අපනයනය කිරීමේ ක්‍රමවත් පහසුකම් ඇතත් මේ පළාතේත් තවත් පළාත් කිහිපයකත් බුලත් වැවීමට එවැනි පහසුකමක් නැත. දැනට මිල දී ඇතීම් සිදු කරන්නේ පෞද්ගලික වෙළඳුන් ය. මේ බෝගය ගැන රජයේ සැලකිල්ල අවශ්‍යම තිබේ.

රංජන් විජේරත්න මහතා.

ජනාධිපති උතුමාණන් හා අමාත්‍යවරුන් හතර දෙනෙකු මේ සම්බන්ධව සාකච්ජා පවත්වා ගම් මට්ට මේ ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය වෙළඳ අමාත්‍යාංශය මගින් මිළයට ගැනීමට යෝජනා කර තිබේ. මාක්/පෙඩ් ආයතනය හා රාජ්‍ය වෙළඳ සංස්ථාව දැනටමත් මේ සම්බන්ධව පියවර ගෙන ඇත. මෙහි දී කථා කළ ප්‍රදේශයේ සත්ව ද්‍රව්‍ය නිෂ්පාදකයිනට මා විශේෂයෙන් පෙන්වා දීමට කැමතියි, බිත්තර හා කුකුල් මස් කොළඹට ගෙනවුත් දෙන්නේ නම් සමූපකාර තොග වෙළඳ සංස්ථාව මගින් කුකුල් මස් රාත්තල 4.50 බැගිනුත්, බිත්තරයක් ශත 60 බැගිනුත් ඕනෑ තරම් මිල දී ගන්න සූදානමින් සිටින බව.

ගොවි මහතෙක්.

පෞද්ගලික වෙළඳුන් රසායනික පෝර සහනාධාර ක්‍රමය යටතේ පෝර විකිණීමේ බලය ලබා ඇතත් බොහෝ දෙනෙක් තම පළාතට නිර්දේශිත නොවන ලාභ පෝර වර්ග ද ගෙන විත් අලෙවි කරයි. මේ සම්බන්ධව ගන්නා ක්‍රියා මාර්ගය කුමක් ද?

රංජන් විජේරත්න මහතා.

දැන් සිදු වන්නේ වෙළඳුන් කොළඹ ගොස් නිර්දේශිත භාවය ගැන එතරම් සැලකිල්ලක් නොදක්වා පෝර ගෙනවුත් අලෙවි කිරීම යි. ගොවීන් ගොවිජන සේවා මධ්‍යස්ථානවල මාර්ගයෙන් ඔවුනට අවශ්‍ය පෝර ලබා දීමට කටයුතු කරනවා නම් මේ වගේ ප්‍රශ්නයක් ඇති වන්නේ නැත. කෙසේ වුනත් දැන් ඒ ඒ දිස්ත්‍රික්කය තුළ පෝර ගබඩා පිහිටුවා දිස්ත්‍රික්කයට අවශ්‍ය පෝර ලබා දෙන්න කටයුතු සලස්වා ඇත්තෙමු. සමූපකාර සමිතිවලට ගොවිජන සේවා මධ්‍යස්ථානවලට හා පෞද්ගලික වෙළඳුන්ට අවශ්‍ය පෝර මෙම ගබඩා වලින් ලබා ගත හැකි යි. එම ගබඩාවේ ගබඩා කෙරෙන් නේ දිස්ත්‍රික්කයට නිර්දේශිත පෝර පමණක් බැවින් ඒ ප්‍රශ්නවලට මෙහි දී විසඳුම් ලැබේ යයි හඟිමි.

ඇම්.ඩී. අමරදාස ගොවි මහතා.

මහායාය වතුයායේ මී හරකුන් ඇති කිරීමේ ව්‍යාපාරයක් පශු සම්පත් මණ්ඩලය විසින් ආරම්භ කළොත් ප්‍රදේශයේ ගොවීන් ගේ ගොවිපල බල අවශ්‍යතාවයන් බොහොමයක් එමඟින් පිරිමසා ගැනීමට පුළුවන් වෙනවා.

ගරු කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ ඇමතිතුමා.

ඇත්තවශයෙන් ම හැම ආසනයකට කුඹුරු ගොවිතැනට අවශ්‍ය මී හරකුන් ඇති කරන ගොවිපලවල් පිහිටුවීමෙන් දැනට ඇති ගොවිපල සත්ව/යාන්ත්‍රික බල හිඟය බොහෝ දුරට විසඳා ගන්නට පුළුවන්. එම නිසා මෙය අප කවුරුත් උනන්දුව දැක්විය යුතු වැදගත් අදහසක්.

සාකච්ඡා වාරයේ නිමාව.

ගරු කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ ඇමති, ඊ.එල්. සේනානායක මැතිතුමා.

කෘෂිකර්ම සංවර්ධනයේ දී අප හැකි තරම් අප ගේ ඉතිහාසයෙන්, අප ගේ උරුමයෙන්, පාඩම් උගත යුතු යි. පුරාණ කාලයේ ගොවිතැන් සරු කිරීමට කටයුතු කළ රජදරුවන් කලාවැව, යෝධ වැව වැනි විස්කම් වාරිමාර්ග තැනීම පමණක් නොව, එතරම් වෙහෙසක් හා වියදමක් දරා ජලාශ වල එක් රැස් කරන ජලය ගොවිතැන් වලට යෙදීම ගොවීන්ට බෙදා දීමේ දී හැම බිඳකින් ම ප්‍රයෝජනයක් ගන්නා බවට වග බලා ගැනීමට ද කටයුතු කර ඇත. පස්වන දප්පුල රජතුමා අවුරුදු දහස් ගණනකට පෙර පිහිට වූ කොන්ඩවට්ටවාන් සෙල් ලිපිය බඳු ලේඛනවලින් වාරිමාර්ග ජලය පරිහරණය පිළිබඳ සංකීර්ණ දැඩි නීති රීති පැනවීමට කටයුතු කිරීමෙන් ඒ බව මනාව පෙනී යයි. මේ අන්දමට ගොවි මහතුන් වන ඔබට ලබා දෙන නොයෙකුත් ආධාර හා සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට එදා මෙන් අද ද උත්සුක විය යුතු ය.

දැන් නව ගොවිජන සේවා පණතින් අඳ ගොවි මහතුන් මේ සම්මේලනයට ඉදිරිපත් කළ ප්‍රශ්න ගණනාවකට විසඳුම් ලැබේ යැයි මාගේ අදහස යි. හැම ග්‍රාම සේවක කොට්ඨාශයක් භාරව කටයුතු කිරීමට වගා නිලධාරී යෙකු පත් කර ඇත්තෙමු. මේ වගා නිලධාරී තැනට ගමේ හැම කෘෂිකර්ම කටයුත්තකට සම්බන්ධීකරණය කිරීමට කටයුතු කර ගොවි මහතාට හැකි හැම සහායක් ම දීමට දිරි ගත යුතු ය.

මා මෙහි දී අප අළුතින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන විශේෂ කටයුත්තක් සඳහන් කරන්නට කැමතියි. එනම්, ගොවි මහතුන් ගේ මාර්ගයෙන් පිටරට වෙළඳ පොළවලට එළවළු හා අතිකුත් භෝග වර්ග නිෂ්පාදනය යි. මෙයින් ගොවි මහතුන් මෙරට පවතිනවාට වඩා දෙතුන් ගුණයක මිලක් ඔවුන් ගේ නිෂ්පාදන වලට ලබා ගත හැකි ය.

## ගොවි මහතුන් පැවැත් වූ කණ්ඩායම් සාකච්ඡාවල වාර්තා.

### 1. පොල්.

#### පොල් වගාව.

සහනාධාර ක්‍රමය යටතේ යටි වගාවන් සඳහා වලවල් කපා සකස් කර සෑහෙන කාලයක් ගත වී ඇති නමුත් තවමත් සිටුවීම සඳහා අවශ්‍ය පොල් පැල ලබා ගත නොහැකි වී තිබේ. මේ සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් යෙදවිය යුතු ය.

පොල් පෝර කලට වේලාවට ලබා ගත නොහැකි වීමේ තත්වයක් උද්ගත වී ඇත. මේ සඳහා සුදුසු බෙදා හැරීමේ වැඩ පිළිවෙළක් සකස් කළයුතු ය.

#### පොල් වගාව යටතේ අතුරු බෝග වගාව.

මේ සඳහා කෝපි, ගම්මිරිස් මෙන් ම කහ හා ඉඟුරුත් සුදුසු වේ.

දැනට සහනාධාර ලබා නොදෙන බෝගවලට සහනාධාර ලබා දෙන ක්‍රමයක් ඇති කළයුතුයි.

### 2. පළතුරු.

දැනට පළතුරු වගා කිරීම උදෙසා කටයුතු කිරීමේ දී අන්නාසි වගාවට ණය ලැබෙන්නේ 'කිව්' වර්ගය වගා කිරීමේ දී පමණ ය. අප මුරිසි වර්ගය වගා කිරීමට ද ණය ලබා දෙ දෙන මෙන් ඉල්ලා සිටින්නෙමු. ඊට හේතු කිහිපයකි. ඒවා නම් ;

1. 'කිව්' වර්ගයට වඩා වැඩියෙන් 'මුරිසි' වර්ගය අලෙවිය පහසු ය.
2. වැඩි අස්වැන්නක් මුරිසි වර්ගයෙන් ලැබේ.
3. මුරිසි වර්ගය වගා කිරීම පහසුයි.
4. මුරිසි වර්ගයේ පැල සොයා ගැනීම ද දැනට අපහසු ය. මේවා සැපයීමේ පියවරක් ගත යුතු ය.

#### කෙසෙල් වගාව.

දැනට පවතින තත්වය අනුව කිසිම සහනාධාරයක් හෝ ණය පහසුකමක් කෙසෙල් වගාවට නැත. එබඳු ආධාර ලබා දීම වැදගත් වේ.

කෙසෙල් පැල අංකුර (නිරෝගී) පැල ලබා ගැනීමට දැනට පහසු මාර්ග නැත. එසේම කෙසෙල් වගාවට වැළඳෙන රෝග පිළිබඳ කිසිම පරීක්ෂණයක් මේ පළාතේ කෙරී නැති අතර ඒවාට සුදුසු ප්‍රතිකර්ම පිළිබඳ උපදෙස් කිසිවකු හට ලැබී නැත.

කෙසෙල් වවන ඉඩම්වල ගහ සහ ඉඟුරු වගා කරන අයට ද සහනාධාර ක්‍රමයක් ඇති කළ යුතු යි.

3. සත්ව පාලනය.

ප්‍රදේශයේ සත්ව නිෂ්පාදකයින් මුහුණ පාන ප්‍රධාන ගැටළුව උසස් තත්වයේ සත්වාහාර ලබා ගැනීමට ඇති අපහසුව යි. සඳලංකාව සමූපකාරයෙන් සත්වාහාර අවශ්‍ය පරිදි ලබා ගත නොහැක. විශේෂයෙන් තෙල් හා මේද සංයුක්ත මණ්ඩලයේ සත්වාහාර ලබා ගැනීමට අපහසුවක් ඇත.

බිත්තර හා මස් සඳහා ඇති කරන සතුන් සාධාරණ මිලකට අලෙවි කර ගැනීම බෙහෙවින් වෙහෙස කර කාර්යයක්ව පවතී. මේ සඳහා සුදුසු මිල දී ගැනීමේ වැඩ පිළිවෙලක් සංවිධානය කරන්නේ නම් මැනවි. වැඩිදෙනා සුළු නිෂ්පාදකයින් බැවින් පොළඹ ගෙන ගොස් අලෙවි කිරීම අපහසු ය.

සතුනට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය ලබා ගැනීමට ප්‍රදේශය තුළ පහසුකම් නොමැත. මේ සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සංවිධානය කළයුතු වේ.

මේ ප්‍රදේශ තුළ නිපදවෙන කිරි අලෙවි කිරීමට කිරි එකතු කරන මධ්‍යස්ථානයක් පත්තල නගරයේ පිහිටු විය යුතු ය.

4. වී ගොවිතැන.

<u>සී සෑම.</u>

- සී සෑම සඳහා රෝද දෙකේ අත් ට්‍රැක්ටර් හෝ මී හරක් මිල දී ගැනීම සඳහා රජයේ ණය ආධාර ලබා දීම හෝ කුලියකට ලබා ගැනීම උදෙසා පහසුකම් සැලසිය යුතු ය. කුඹුරු අක්කර 1 1/2 ට වඩා වැඩි ප්‍රමාණයක් වගා කරන කෙනෙකුට අත් ට්‍රැක්ටර් ලබා ගැනීමට පහසුකම් සලස්වන්නේ නම් මැනවි.

<u>කන්න රැස්වීම්.</u>

ගොයම් කපා ඉවර වූ විගස ඊළඟ කන්නය උදෙසා කන්න රැස්වීම් පවත්වා සියලු නීති රීති

සම්මත කර ගැනීම සහ සම්මත කර ගත් කාර්යයන් නොසලකා හරින අයට නීති මගින් කටයුතු කිරීම කළයුතු ය.

<u>කුඹුරු පෝර හා රසායනික ද්‍රව්‍ය.</u>

සෑම වගා නිලධාරී කොටසකම කුඹුරු පෝර හා රසායනික ද්‍රව්‍ය ගබඩා කර බෙදා හැරීමේ ක්‍රමයක් ආරම්භ කිරීම. (ගබඩා පහසුකම් සැපයිය යුතු ය).

<u>බිත්තර වී ලබා ගැනීම.</u>

සෑම වගා නිලධාරී කොටසකම බිත්තර වී ගොවිපලක් ආරම්භ කළයුතු ය. තවද, මීට අමතර වශයෙන් හැම ගොවියෙකුටම කරදරයක් නොමැතිව බිත්තර වී සපයා ගැනීමට පහසුකම් සැලැස්විය යුතු වන අතර, හැකි සෑම විටම රජයේ බිත්තර වී ගොවිපලවලින් අත් හිතාරම් වශයෙන් බිත්තර වී සපයා දීමට ද කටයුතු කළයුතු වේ.

<u>ජලය සැපයීම.</u>

උස්සාන වාරිමාර්ග ක්‍රම හෝ සුළු වාරිමාර්ග සකස් කර ක්‍රමවත්ව ජලය බෙදා හැරීම සඳහා කටයුතු කළයුතු ය. තවද, ඒ අන්දමේ වාරිමාර්ග වලින් ජලය බෙදා හරින ප්‍රදේශය පුළුල් කළයුතු ය. ජලය බෙදා හැරීම පාලනය කිරීමට නිලධාරී මහතෙකු පත් කළයුතු ය.

<u>වගා ණය.</u>

කුඹුරු වගාවන් ආරම්භ කිරීමට ප්‍රථම වගා ණය ලබා දීමට බැංකු කටයුතු කළයුතු ය. දැන් වගා ණය ලැබෙන්නේ බෙහෙවින් පමා වී ය.

<u>කන්න දෙකක් අතර කුර වී වගාව.</u>

මෙහි දී අඩු වයස් වී වර්ග පමණක් වගා කිරීම සිදු කෙරේ. කුඹුරු ගොවිතැන්හි ඉහළ ප්‍රතිඵල මේ ක්‍රමයෙන් ලබා ගත හැකි යි.

කෙසේ වුව ද, මේ සඳහා යායේ ගොවීන් ගේ එකඟත්වයක් **තිබීම** වැදගත් ය. නොඑසේ නම්, කඩින් කඩ වගාවන් කෘමි රෝග උවදුරු කොදින් ඇති විය හැකි යි. මේ අන්දමට ගොවිතැන් කිරීමේ දී අහස් දිය කෙරෙහි බලාපොරොත්තු තැබිය නොහැක. එහෙයින් නල වාරිමාර්ග ක්‍රමයන් ඇති කිරීමේ ඉඩකඩ සොයා බැලිය යුතු ය.

කුඹුරුවල කවුපිර බෝග වගාව.

මේ උදෙසා බුෂිටාවෝ මෑ වර්ගය මේ පළාත්වලට කදිමය. වී වගා කළ නොහැකි වියළි කන්නවල හා ජලය ලබා ගැනීමට අපහසු උස් ප්‍රදේශවල පිහිටි කුඹුරුවල වගාවට කදිම ය.

5. බුලත් වගාව.

1. ජලය සැපයුම.

මේ සඳහා අඳ ශෙවියාට අවශ්‍යව ඇති **ඉද්** වතුයේ වතුර පොම්ප හා ළිං කපා ගැනීමට ණය පහසුකම් ය.

2. අමු ද්‍රව්‍ය හිඟකම.

අ. පශු සම්පත් මණ්ඩලයට අයත් ගව පාලනය කරන ඉඩම්වලින් අපගේ යන චෛත් ද්‍රිය (ගොම පෝර) පළාතේ ගොවීන්ට ලබා ගැනීමට අවකාශ සලස්වා දිය යුතු යි.

ආ. කැලෑ වලින් දුර බැහැරව පිහිටි ප්‍රදේශවල ගොවීනට ඉනි සැපයිය යුතු යි.

ඇ. කෘෂිකාර්මික දැනුම : බුලත් රෝග, ප්‍රතිකාර ක්‍රම, රසායනික පෝර යෙදීම හා ගව වර්ග ගැන විද්‍යාත්මක දැනුමක් ගොවීනට ලබා දීම.

3. වගාවන්ට අවශ්‍ය ඉඩම් හිඟකම.

4. අලෙවිය

ස්ථාවර මිළක් යටතේ අලෙවි කිරීමට සැලැස්වීම.



22182